වාර්ෂික වාර්තාව 2011

ஆண்டறிக்கை 2011

Annual Report 2011

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය

இலங்கை சுற்றுலா மற்றும் ஹோட்டல் முகாமைத்துவ நிறுவகம்

Sri Lanka Institute of Tourism & Hotel Management

වාර්ෂික වාර්තාව

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය

2011



පටුන

හැඳින්වීම, දැක්ම 01

මෙහෙවර, තේමාව, හරය 02

අරමුණු 03

විශේෂිත පරමාර්ථ 03

ආර්ථික සංවර්ධන අමාත්‍ය 04
ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ පණිවුඩය

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය 05

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ 06
ආයතනයේ 2011 ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

ප්‍රාදේශීය පාසල් 06

අධ්‍යයන කාර්යය මණ්ඩලය 07

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ 09
ආයතනයේ අද්විතීය ජයග්‍රහණයන්

සංචාරක ව්‍යාපාරය දෙනු ලබන දායකත්වය 09

2011 කාර්යසාධනයේ විශේෂ අවස්ථා 11

සුපවේදී පීඨය 11

ආහාර පාන පීඨය 12

සංචාරක සම්පත් වැඩි දියුණුකිරීමේ ව්‍යාපෘතිය 12

ප්‍රවේශ සුදුසුකම් 18

වර්තමාන වැඩසටහන් 19

අධ්‍යයන කාර්යසාධනය 20

පුහුණු කිරීමේ පහසුකම් 21

අනුබද්ධකිරීම්, දේශීය/විදේශීය 22
විශ්වවිද්‍යාල සහ ආයතන

ආධුනිකත්ව පුහුණුව 22

වෘත්තීය සංවර්ධනය 23

පාඨමාලා විස්තර 24

අපගේ වටිනා සේවක මඩුල්ල 24

2011 මූල්‍ය ප්‍රකාශන 25

හැඳින්වීම

වසර 2016 දී ලංකාවේ සංචාරක කර්මාන්තය විසින් සංචාරකයින් මිලියන 2.5 ක් මෙරටට ගෙන්වාගැනීමට බලාපොරොත්තු වේ. මෙවන් විශාල සංචාරක ආගමනය තුළ සංචාරක කර්මාන්තයේ 600,000ක් පමණුවන ශ්‍රම බලකායේ ප්‍රමාණාත්මක වටිනාකම සඳහා ඉල්ලුමක් ඇතිවේ. මිනිස් බලයේ නිශ්චිත හිඟය වාර්ෂිකව ඇතිකරනු ලබන පුහුණු බලකාය 1,500 ක මත පැතිර පවත්නා ක්‍රමය ම!ගින් ප්‍රතකෂකරනු ලබයි.

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය ආසියාවේ ආගන්තුක සහ සංචාරක පුහුණුකිරීම සලකනු කිරීමේ දැක්මක් සමඟ වෙළඳපළ දිශානත තත්ත්වයෙන් උසස් හෝටල් සහ සංචාරක පුහුණු නිෂ්පාදන හරහා ඉලක්කගත අරමුණක් කරා යන රටේ ජාතික සංචාරක පුහුණු ආයතනය වේ.

කොළඹ ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය ඒ වෙනුවෙන්ම නිර්මාණය කරන ලද
ප්‍රමිතියකින් යුතු කාමර 12 කින් සහ සුපිරි කාමරයකින් යුතු හෝටල් පාසලක් ස්ථාපිත කර ඇත. කොළඹ 02 ගාලු පාරේ අංක 78 දරණ ස්ථානයේ පොදු අවන්හලකින් සහ බීම හලකින් යුතු සමුද්‍රා හෝටලය නමින් පුහුණු හෝටලය පවත්වාගෙන යනු ලබයි. පෙර පැවැති සැෆ්වන් හෝටලය පිහිටියේ ද මෙම ස්ථානයෙහිය.

කොළඹ ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ පිහිටි තඟීර් ශ්‍රවණාගාරය නගරයේ සම්මේලන, ව්‍යාපාරික රැස්වීම් සඳහා පහසුකම් සලසන ක්‍රියාකාරී ශ්‍රවණාගාරයකි. මෙම ශ්‍රවණාගාරය රංගශාලාවක ශෛලියකින් යුතු ප්‍රේක්ෂකයින් 250 කට පමණ අසුන්ගත හැකි (තට්ටු ලෙස සකසා ඇති) වායුසමනයකර උස්වූ වේදිකාවකින් යුතු උසස් ශ්‍රවණ පහසුකම් යොදා ඇති මුළුමනින්ම බුමුතුරුණු ඇතිරූ ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ආදී සියලු ශ්‍රවණාගාර පහසුකම් සහිතව ඉදිරිපත්කර ඇත.

පාදේශීයව සංචාරක පුහුණු ලබාදීම උදෙසා පාදේශීය පාසල් මහනුවර, අනුරාධපුර, කොග්ගල, බණ්ඩාරවෙල සහ රත්නපුර ක්‍රියාත්මක වෙමින් පවතී.

කොළඹ ශ්‍රීලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය නවීන පායෝගික සහ තාක්ෂණික සංවර්ධන
තත්ත්වයයන් සහ නවීන උපකරණ සහිත පායෝගික මුළුතැන්ගෙවල් දෙකක් සිසුන් වෙනුවෙන් සකසා ඇත.
එසේම, ඔවුන්ගේ පායෝගික පුහුණු සඳහා පුහුණු අවන්හල් දෙකකින් ද සමන්විත වන අතර එහි අවන්හල් නවීන උපකරණ සහ පොදු අවන්හලකින් සහ බීම හලකින් සමන්විතය. ඒ හරහා සිසුන් කැටයම්කරණය, මස්
මාංශ සහ සලාද වර්ග සැකසීම සඳහා ඒවා අමුත්තන් හට පිළිගැන්වීමේ උපකරණවලින් සමන්විත වේ.

ශිෂ්‍යයින් සඳහා ඔවුන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම වැඩිදියුණු කරගැනීම උදෙසා පරිගණක විද්‍යාගාරකින් සමන්විත වන අතර හෝටල් පාසලේ පිහිටි ශ්‍රී ලංකාවේ පිහිටි උසස්ම සංවරණය පිළිබඳ පුස්තකාලය පරිහරණය සඳහා සිසුන්ව උනන්දුකරවනු ලබයි.

දැක්ම

ආසියාවේ සංචාරක සහ ආගන්තුක සත්කාරක අධ්‍යාපනය සඳහා වන ක්‍රියාශීලී මධ්‍යස්ථාන අතුරින් එකක් බවට පත්වීම.

මෙහෙවර

- සංචාරක සහ ආගන්තුක සත්කාරක කර්මාන්තයේ නැඹුරුතාවයන් වෙනස්කරමින් අභියෝගකරමින් සහ ඒ අනුව යමින් සංචාරක සහ ආගන්තුක සත්කාරක කර්මාන්තයේ ඉල්ලුමට අවශ්‍ය මිනිස් බලය පුහුණු කිරීම.
- ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කරන අතරතුර ජාතික සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සංචාරක සහ ආගන්තුක සත්කාරක අධ්‍යාපනය ලබාදීම.
- සංචාරක සහ ආගන්තුක සත්කාරක ක්‍ෂේත්‍රයේ ස්ථිරසාර වර්ධනය පිළිබඳ සහතික වෙමින් රටේ විවිධ ප්‍රදේශයන්හී ජීවත්වන තරුණ තරුණයින් සඳහා අපක්‍ෂපාතී රැකියා පරිසරයක් සහ සමාන වරප්‍රසාද ලබාදීම.

තේමාව

අභිමානවත් ලෙස ලොවම ජයගන්න.

ශ්‍රී ලාංකික සත්කාරක සේවයේ විශිෂ්ඨයෙකු වන්න.

සාරධර්ම

ගුණාත්මකභාවය

විශිෂ්ඨ නිෂ්පාදනයන් සහ සේවාවන් එක්ව ලබාදීම හරහා ශිෂ්‍යයින් සඳහා වැඩි අගයක් ලබාදීම.

අධ්‍යාපන න්‍යාය

සෑම ශිෂ්‍යයෙකුම සඳහා අපගේ ප්‍රමිතීන් හරහා ජයග්‍රහණයන්, සහභාගීවීම් සහ දැනුම වර්ධනය සඳහා සහතිකවීම.

සම්පූර්ණත්වය - සෑම කාර්යයක් සඳහාම සම්පූර්ණත්වයේ සහ වෘත්තීය ආචාරධර්ම උසස් ප්‍රමිතීන් අනුව ක්‍රියාකිරීමට උත්සාහ කිරීම.

සාමුහික ප්‍රයත්නය - ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ අරමුණු සාක්‍ෂාත් කරගැනීම සහ අප සියුන්ගේ අවශ්‍යතා සපිරීම උදෙසා සීමාමායිම් කඩයිම් හරහා සාමුහිකව ක්‍රියාකිරීම.

ගරුත්වය - මිනිස් ශ්‍රමයට වටිනාකමක් ලබාදීම සංවර්ධනය සඳහා උනන්දුකරවීම සහ කාර්යයසාධනය අගයකිරීම.

යහපත් පුරවැසිබව - රටට සහ සමාජයට ඵලදායී පුරවැසියන්වීම.

ස්ථිරසාරභාවය - දේශීයව ප්‍රයෝජනවත් සහ සාමාජීයව වැදගත් සංස්ථායිත වර්ධනයක් ලුහුබැඳයාම.

අරමුණු

- පුහුණු ක්‍රමවේදයේ කලින් කලට සිදුකරනු ලබන සංශෝධනයන් සහ විෂයය මාලාවේ සංවර්ධනයන් හරහා ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ වර්තමාන සංචාරක අධ්‍යාපනික වැඩසටහන් ඇගයීම.
- කර්මාන්තයේ අවශ්‍යතා සැපිරීමට නව සංචාරක අධ්‍යාපනික වැඩසටහන් සංවර්ධනය තුළින් දේශීය සහ ලෝක ව්‍යාප්ත සංචාරක කර්මාන්තයේ මානව සම්පත් අවශ්‍යතා සඳහා යොමුකිරීම.
- ඊළඟ වසර තුන ඇතුළත ලෝක සංචාරක සංවිධානයේ ප්‍රමිතීන් වෙත ළඟාවීම.
- උපායමාර්ගික ගිවිසුම් හරහා පුළුල්කිරීම් වෙත ළඟාවීම. වසර දෙකක් ඇතුළත ජාතික සහ ජාත්‍යන්තර කොටස්කරුවන්ගේ ජාලයක් ඇතිකරලීම.
- අවුරුද්දක් ඇතුළත සේවක මඩුල්ල සඳහා වෘත්තිය සංවර්ධනය සඳහා පහසුකම් සැලසීමට සහ තත්ත්වය ගොඩනැගීමට අදාළව කැපවූ මානව සම්පත් සංවර්ධන ඒකකයක් ගොඩනැංවීම.
- ශ්‍රී ලංකාවේ සංචාරක අධ්‍යාපනික පහසුකම් සඳහා වන රාමුව පිළිබඳ සොයා බැලීම සහ ප්‍රමිතීන් සංවර්ධනය කිරීම තුළින් 2005 ජාතික සංචාරක පනතේ සඳහන් ජාතික සංචාරක අධ්‍යාපනික ප්‍රතිපත්තීන් අනුව යාම.

විශේෂිත පරමාර්ථ

- නව විෂයානුබද්ධ දැනුම සහ ගුණාත්මක ඉගැන්වීම් සහ ඉගැන්වීමේ ක්‍රමවේද උසස්කිරීම.
- පීඨ සාමාජිකයින් සඳහා ඉගැන්වීමේ ක්‍රමවේදයන් සහ අධ්‍යාපනවේදය අනුව පුහුණු කරන්නන් පුහුණුකිරීමේ වැඩසටහන් දියත්කිරීම.
- සංචරණයට අදාළ කුසලතාවන් උසස් කිරීම සඳහා හෝටල් සේවකයින් පුහුණුකිරීම.
- ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය සඳහා නව විෂයමාලාවක් ඇතිකිරීම.
- නව විෂයමාලාව ක්‍රියාත්මකකිරීම සහ ඇගයීම සඳහා සහයවීම.
- තොරතුරු මධ්‍යස්ථාන සහ ප්‍රජා මූලික සංචාරණය හරහා සංචාරක තොරතුරු නිර්ණයකිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම.

ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය

සංචරණය ශ්‍රී ලංකා ආර්ථිකයේ එක් ප්‍රධාන යාන්ත්‍රණයක් වේ. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් ක්‍රියාවට නංවා ඇති සංචාරක සංවර්ධන උපායමාර්ගික සැලස්ම හරහා මහින්ද චින්තනය අනාගත දැක්ම පදනම්ව පරිසර හිතකාමී තිරසාර
සංචාරක කර්මාන්තයක් උත්පාදනය කිරීමට බලාපොරොත්තු වේ.

මෙම උපාය මාර්ගික සැලස්ම අනුව කර්මාන්තයට අදාළ රාජ්‍ය ප්‍රතිපත්තීන් අනුගමනයකිරීම, අවශ්‍යතා අනුව මිනිස් බලය ගොඩනැංවීම, යටිතල පහසුකම්, සංවර්ධනය, සේවා ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම, අලෙවිකරණය සහ ප්‍රවර්ධනය, ප්‍රජා සම්බන්ධතා, සංචාරක සුරක්ෂිතභාවය සහ දේශීය සංචරණය සඳහා වැඩිදියුණුකිරීම ආදී පුළුල් ක්ෂේත්‍රසම්බන්ධ කරගනිමින් ක්‍රියාකිරීමට බලාපොරොත්තු වේ.

මහින්ද චින්තනයේ ප්‍රධාන දර්ශනය අනුව යමින් මෙම උපාය මාර්ගික සැලැස්ම අනුව රටේ ජනතාව ආර්ථික සංවර්ධනයේ මූලික අර්ථලාභීයා බවට පත්කිරීම බලාපොරොත්තුවේ. ඒ අනුව, ශ්‍රී ලංකාවේ ප්‍රධාන සේවාව ලෙස සංචාරක කර්මාන්තය සංවර්ධන කිරීමේ දී සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රතිලාභ අඩු ආදායම්ලාභීන් සඳහා බුක්තිවිඳීමට ඉඩසලසාදීම සුරක්ෂිතකිරීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මහත් පරිශ්‍රමයක් දරනු ඇත.

බැසිල් රාජපක්ෂ
ආර්ථික සංවර්ධන අමාත්‍ය
ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය



අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ (ප්‍රධාන විධායක නිලධාරී) පණිවුඩය

අද ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය නව අභියෝගයන්ට මුහුණ දෙමින් දේශීය අගන්තුක සත්කාරක කර්මන්තයේ පෙර නොවූ වර්ධනයක් පෙන්නුම් කරමින් සිටී. 2016 දී ශ්‍රී ලංකාවට සංචාරකයින් මිලියන 2.5ක් ගෙන්වාගැනීමේ බලාපොරොත්තුව ඇතිව 2013 දී ලෝකයේ වඩාත් එලදායී ගමනාන්තය ලෙස ශ්‍රී ලංකාව ශක්තිමත් කිරීමේ කාර්යයට උර දෙමින් රජය ක්‍රියාකරමින් පවතී. දේශීය වෙළඳපොළට කීර්තිමත් ජාත්‍යන්තර ආගන්තුක වර්ගීකරණන් සමඟ පිවිසීමෙන්, කල්පිටිය, ත්‍රිකුණාමලය, පාසිකුඩ සහ කල්කුඩා ආදී තානායම් ගමනාන්තයන්හී සීග්‍ර පුළුල් කිරීම් සමඟ ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය විසින් මානව සම්පත් අවශ්‍යතා වැඩිවීම හා යෝග්‍යවන පරිදි පුහුණු පිරිස් සැපයීමට කටයුතු කරනු ලබයි.

වසර 40 කට අධික කාලයක් සංචාරක පුහුණු අවශ්‍යතා සපයනු ලබන ප්‍රමුඛතම ආයතන ලෙස ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය අපගේ පවතින පුහුණු පාඨමාලා ලෝ ව්‍යාප්ත ප්‍රමිතීන් හා සමව පවත්වාගෙන යාම සහතික කරණු පිණිස මහත් පරිශ්‍රමයක් දරමින් සිටී. ඒ අනුව, මේ සඳහා දේශීය සහ ජාත්‍යන්තර වෙළඳපොළේ මතුකර පෙන්වනු ලබන සුදුසු නව පාඨමාලා අපගේ පුහුණු සඳහා හඳුන්වා දෙමින් පවතී. වර්ථමානයේ සමුද්‍රා හෝටලය සියලු පහසුකම් සහිතව වැඩිදියුණුකර කථිකාචාර්ය වරුන්ගේ අධීක්ෂණය යටතේ මුළුමනින්ම පාසලේ ශිෂ්‍යයින් විසින් මෙහෙයුම් සිදුකිරීමට පියවර ගෙන ඇත.
එසේම, පේස්ට්‍රි, බේකරි මෙන්ම ලොන්ඩ්‍රි ආශ්‍රිත පාඨමාලා ද හඳුන්වාදී ඇත. තවද, කොළඹ පිහිටි ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතන භූමියේ ලොන්ඩ්‍රියක්, කෙටිකෑම හලක් සහ ව්‍යාපාර මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට ද අප බලාපොරොත්තු වෙමු.

මෙම සියලු උත්සාහයන් හරහා සංචාරක කර්මාන්තය සඳහා උසස් ප්‍රමිතියෙන් යුතු සේවාවක් සපයනු පිණිස අවශ්‍ය උසස් මිනිස් බලයක් ලබාදීමට ඇති හැකියාව නොකඩවා පවත්වාගෙනයාමට ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයට හැකිවේවායන්න අපගේ උදක් බලාපොරොත්තුව වේ.

සේනක විජේවර්ධන
අධ්‍යක්ෂ ජනරාල්/ ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය 2011
කොළඹ

අධ්‍යක්ෂ ජනරාල්
සේනක විජේවර්ධන

ලේඛකාධිකාරී
මාලිනී ගනේගොඩ මහත්මිය

වැඩ බලන නේවාසික කළමනාකරු
ධම්මික ගුණතිලක මහතා

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

රීසා(z) ඩීන් මහතා
ඉන්ද්‍රානි විජේගුණවර්ධන මහත්මිය
එච්. කේ. චාමන් පෙරේරා මහතා
තිලක් පතිරණ මහතා
මංගල සුරවීර මහතා

පාදේශීය පාසල්

විදුහල්පතිනි, මහනුවර (වැ.බ.)
කුමුදුනී වික්‍රමසිංහ මහත්මිය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මහනුවර
නලීන් කහටපිටිගම මහතා

විදුහල්පති. කොග්ගල
ප්‍රබෝද කුලතුංග මහතා

විදුහල්පති, අනුරාධපුර
ගාමිණී අන්ද්‍රාහෙන්නදි මහතා

ස්ථානභාර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, රත්නපුර
කනිෂ්ක එන්. ජයතුංග මහතා

ස්ථානභාර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, බණ්ඩාරවෙල
රියන්සි ජයවර්ධන මහතා

නියෝජ්‍ය අධ්‍යක්ෂ පාලන
අශෝක පෙරේරා මහතා

වැඩ බලන සහකාර අධ්‍යක්ෂ මුල්‍ය
මේරියන් ප්‍රනාන්දු මහත්මිය

සහකාර අධ්‍යක්ෂ නඩත්තු
රන්ජන් ප්‍රනාන්දු මහතා

අධ්‍යයන කාර්යය මණ්ඩලය, කොළඹ

අධ්‍යයන කාර්යය මණ්ඩලය, මහනුවර

අධ්‍යයන කාර්යය මණ්ඩලය, කොග්ගල

අධ්‍යයන කාර්යය මණ්ඩලය, බණ්ඩාරවෙල

අධ්‍යයන කාර්යය මණ්ඩලය, රත්නපුරය

අධ්‍යයන කාර්යය මණ්ඩලය, අනුරාධපුරය

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ අද්විතීය ජයග්‍රහණයන්

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය ප්‍රමුඛතම සංචාරක පුහුණු ආයතනය ලෙස එහි තත්ත්වය පවත්වාගෙන යාමට සමත්වී ඇත. පළමුවරට සංචාරක කුසලතා සඳහා ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය විසින් ඉල්ලුම් කරන ලද අතර එහිදී වර්ගීකරණ අංශ 9 යටතේ ජයගාහකත්වය ලබාගන්නා ලදී. මෙය පාසල ලබා සිටි තත්ත්වය නැවත නැවත සහතික කිරීමකි.

National Bartender cocktail තරඟාවලිය සංචාරක කර්මාන්තයේ තැබෑරුම් කාර්යමණ්ඩල (Bar Tenders) අතර පැවැත්විණ. මෙම තරඟාවලියේ ජයගාහකයා සියලු ගෙවීම් සහිතව සිංගප්පූරුවේ පුහුණු වැඩසටහනක් සඳහා යොමුකරන ලදී. අධුනික අංශය යටතේ අවසන් තරඟාවලිය සඳහා සහභාගීවීමටත් ඒ සඳහා ශිෂ්‍යයින් 5 දෙනෙකු සහභාගීකරවීමටත් අවස්ථාව ලබාගන්නා ලදී. මෙය ඉතා ඉහළ පළපුරුද්දක් ඇති තැබෑරම් කාර්යමණ්ඩල (Bar Tenders) අතර පැවතිණ. ඒ අතරින් හෝටල් පාසලේ සිසුන් Most Creative Cocktail වෙනුවෙන් ජයග්‍රහණය ලබාගැනීමට හැකියාව උදාකරගන්නා ලදී.

සංචාරක කර්මාන්තයට දෙනු ලබන දායකත්වය

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය රජයේ ආගන්තුක අධ්‍යාපන ආයතනය ලෙස සාමාන්‍ය සේවා වැඩකාර්යයන්ට අමතරව කථිකාචාර්යවරුන්ගේ ප්‍රවීණ දැනුම අවශ්‍ය සංවිධාන සඳහා ලබා දෙනු ඇත. ඒ ඒ සංවිධානයන්ගේ අවශ්‍යතාවයන් අනුව පාඨමාලා සකස් කරනු ලබයි.

කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර පුහුණුව 2011				
	ක්ෂේත්‍රය	සංවිධානය	කාලය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
1.	තානායම් සේවා කාර්යය මණ්ඩල පුහුණුව	ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	මාර්තු 12, 13	36
2.	ආහාර ගැනීමේ පිළිවෙළ සහ ආහාර පාන සේවා පුහුණුව	බ්‍රිතාන්‍ය ඇමරිකානු දුම්කොළ සමාගම	අප්‍රේල් 5, 6	15
3.	කෑම බීම සහ බොජුන් හල් කළමනාකරණය	ශ්‍රී ලංකා නාවික හමුදාව	අප්‍රේල් 18 - 29	14
4.	ආහාරපාන සේවා සහ ගෘහපාලන පුහුණුව	අරලියගහ මන්දිරය	මැයි 3 - 6 9 -12	93
5.	නිලධාරීන් සඳහා ආගන්තුක සත්කාර පුහුණුව	අරලියගහ මන්දිරය	මැයි 16 - 23	03
6.	සත්කාරක නිවාස වැඩසටහන	ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	ජූනි 18, 25	85
7.	ආහාර පාන පුහුණුව කාර්යාල සහායකයින් ස!දහා	කෘෂිකර්ම අමාත්‍යාංශය	අගෝස්තු 20	10
8.	ආහාර පාන පුහුණුව කාර්යාල සහායකයින් ස!දහා	සිවිල් හා ගුවන්සේවා අමාත්‍යාංශය	අගෝස්තු 27	12
9.	උපාධි අපේක්ෂකයින් ස!දහා ආහාර ගැනීමේ පිළිවෙත්	කළමනාකරණ පීඨය, වයඹ විශ්වවිද්‍යාලය	දෙසැම්බර් 17	45
10.	වෘත්තීය පුහුණු වැඩමුළුව	නෙස්ලේ ආයතනය	දෙසැම්බර් 10	50
11.	ආහාර පාන කෙටි පුහුණුව කණිෂ්ඨ සේවක මඩුල්ල ස!දහා	ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය	දෙසැම්බර් 17	08
12.	ආහාර ආරක්ෂණය පිළිබ!ද දැනුවත් කිරීමේ වැඩසටහන	නාවලපිටිය නගරසභාව	දෙසැම්බර් 20	35

2011 කාර්යයසාධනයේ විශේෂ අවස්ථා

නවාතැන් කළමනාකරණ මෙහෙයුම් (Accommodation Operations) පීඨය, කොළඹ.

- සංචාරක සම්පත් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජපානයේ Ritsumeikan ආසියානු ශාන්තිකර විශ්වවිද්‍යාලයේ ආචාර්යය Kayhan Tajeddini සමඟ 2011 අගෝස්තු 8 සිට 18 දක්වා හෝටල් කළමනාකරණ වැඩමුළුවට සහභාගීවීම.
- Karcher පිරිසිදු කිරීමේ උපකරණ ගෙන්වන්නන් වන තුඩාව වෙළඳ පුද්ගලික සමාගම සමඟ එක්ව ගෘහ පාලන පීඨය විසින් ගෘහ පාලනය සහ පිරිසිදු කිරීම සඳහා නව උපකරණ හඳුන්වාදීමේ එක් දින පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී.

සූපවේදී පීඨය

- කොළඹ විහාරමහාදේවී උද්‍යානයේ පැවැති "කිතුලක අරුණ" ප්‍රදර්ශනයේ වෙළඳ කුටියක් පවත්වන ලදී.
- රස සරණිය Easy Food Health Guide යන සඟරා සඳහා ආහාර වට්ටෝරු සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සපයන ලදී.
- 2011 මාර්තු මස ස්පාඤ්ඤ ජාතික සූපවේදීවරයෙකු විසින් පවත්වන ලද Molecular Cooking වැඩසටහන සඳහා සහභාගීවීම.
- සංචාරක සම්පත් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජපානයේ ටොකියෝහි සුප්‍රසිද්ධ අවන්හලක් වන KINOBU හි Takuji Takahashi සහ Junji Takahashi මහතුන් (සම්පත්දායකයින්) සමඟ 2011 අගෝස්තු 10 වන දින සිට සැප්තැම්බර් 07 වන දින දක්වා පැවති සාම්ප්‍රදායික ජපන් සූප ශාස්ත්‍රය පිළිබඳ වැඩසටහන සඳහා සහභාගී වීම.
- 2011 සැප්තැම්බර් මාසයේදී ජපන් සූපවේදය සහ ආහාර සංස්කෘතිය නමින් පොත් පළකිරීම.

ආහාර පාන පීඨය

- 2011 ඔක්තෝබර් 07 වන දින පළමු Table Top තරඟාවලිය ශ්‍රීලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය විසින් පවත්වන ලදී. එය පාසලේ සිසුන් සඳහා විවෘතව පැවතිණ.
- ශ්‍රීලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ සහය ඇතිව Free Lank පුද්ගලික වෙළඳ ආයතනයේ අනුග්‍රාහකත්වයෙන් ශ්‍රී ලංකා හොටල් පාසල් උපාධිධාරී සංගමය විසින් සංවිධානය කළ 26 වන National Bartender තරඟාවලිය සඳහා ආහාර පාන අංශයේ සිසුන් සහභාගී විය.

සංචාරක සම්පත් වැඩි දියුණුකිරීමේ වැඩසටහන

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ සංචාරක සම්පත් ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය ඇතුළත මානව සම්පත් සංවර්ධන සංරචකයේ පළමු වගන්තිය ක්‍රියාවට නැංවීම.

හඳුන්වාදීම

ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ සහය ඇතිව ශ්‍රී ලංකා රජයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් සංචාරක සම්පත් ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතියේ මානව සම්පත් සංවර්ධන සංරචකය දියත්කර ඇත.

මානව සම්පත් සංවර්ධන සංවරකයෙහි අරමුණ

මෙහි සමස්ථ අරමුණ වුයේ විදේශ විනිමය ඉපයීමත් සංචාරකයින් ආකර්ශනය කරගැනීමත් විශේෂයෙන් ජපන් සංචාරකයින් ආකර්ශනය කර ගැනීම ම!ගින් ආදායම් මාර්ග ඇති කර ගැනීම හරහා ජනතාවගේ අදායම් මට්ටම වැඩිදියුණු කිරීම සහ දුප්පත්කම අවම කිරීමත්ය.

මෙම වැඩසටහනින් විශේෂයෙන්ම අවධානය යොමුකර ඇත්තේ ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ කාර්යය මණ්ඩලයේ කුසලතාවයන් ඉහළ නැංවීමට සහ ශ්‍රී ලංකාවට ඉහළ වෙළඳපළක් සහිත සංචාරකයින් විශේෂයෙන් ජපන් සංචාරකයින් ආකර්ශනය කරගැනීම සඳහා ජාත්‍යන්තර මට්ටමේ සේවා තත්ත්වයන් ලබාගැනීමට අවස්ථාවන් සලසාදීමටත්ය.

මෙම අරමුණ මුදුන්පත්කරගැනීම උදෙසා කාර්යය මණ්ඩලයේ වෘත්තීය සහ විෂයානුබද්ධ සංවර්ධනයක් අතිකරලීමට පිළිගත් ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයක හෝ ආයතනයක සේවාව ලබාගැනීමටත් ඉහළ වෙළඳපළ සහිත සංචාරක දේශාන්තයන්හී අවශ්‍යතා අනුව විෂයමාලාවේ තත්ත්වය ඉහළ නැංවීමටත් යෝජනාකර ඇත.

Ritsumeikan භාරය

මෙම කාර්යය සඳහා තරඟකාරී ලංසු කැඳවීමක් හරහා මෙම උපදේශන කොන්ත්‍රාත්තුව ආසියානු ශාන්තිකර විශ්වවිද්‍යාලයට ප්‍රදානයකරන ලදී. ආසියානුශාන්තිකර විශ්වවිද්‍යාලය මෙම Ritsumeikan භාරයේ කොටසක් වන අතර එය ජපානයේ තුන්වන විශාල අධ්‍යාපන ක්‍රමය වේ. මෙම වැඩසටහනට ජාත්‍යන්තර තත්ත්වයක් ලබාදීම සඳහා හොංකොං පොලිටෙක්නික් ආයතනයේ ඔස්ට්‍රියාවේ සල්ස්බර්ග් ආයතනයේ සහ විලියම් ඇන්ග්ලිස් විශ්වවිද්‍යාලයේ සහය ඇතිව උපදේශකයින් ගෙන්වාගනී.

විශේෂිත ක්‍රියාකාරකම්

මෙම සංරචකය යටතේ විශේෂිත ක්‍රියාකාරකම් උප සංරචක කොටස් 3 කට බෙදා දැක්විය හැක.

1. පුහුණු කිරීමේ වැඩසටහන් පුහුණුව
2. සංචාරක ව්‍යාපාරයට අදාළ වැඩසටහන් පුහුණුව
3. විෂයමාලා සංවර්ධනය

පුහුණු කිරීමේ වැඩසහටහන් පුහුණුව

මෙම වැඩසටහනේ මෙම උප සංරචකයේ අරමුණ වුයේ ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ අධ්‍යාපන පීඨ සඳහා විශේෂ අවධානය සමඟ සංචරණ ව්‍යාපාරය තුළ මෙම පීඨ සංවර්ධනය කිරීමයි. අදාළ වැඩසටහනේ නිගමනයන් අනුව පුහුණු පීඨ සාමාජිකයින් හට ඔවුන්ගේ සහභාගීත්වය වෙනුවෙන් සහතික පත්‍රයක් ලබා දෙන ලදී. මෙම සංරචකය යටතේ පැවැත් වූ වැඩසටහන් පහත පරිදි වේ.

අධ්‍යාපනික පුහුණුව

මෙම අධ්‍යාපනික පුහුණුවේ අරමුණ වුයේ පීඨ සාමාජිකයින් හට ක්‍රියාකාරී ඉගැන්වීම් ශිල්පීය ක්‍රම හඳුන්වාදීමයි.

මෙම වැඩසටහන සියලුම අධ්‍යයන කාර්යය මණ්ඩලයන්ගේ අවශ්‍යතාවය අනුව වෙනස් ආකාර 3 කට අනුව පැවැත්විණ. එම ආකාර තුනෙන් දෙකක් හොංකොං පොලිටෙක්නික් විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනික පුහුණුව පිළිබඳ ප්‍රමුඛ පුහුණුකරන්නෙකු වන ඇඩෙල් ගැහැම් මහත්මිය විසින් පවත්වන ලදී.

සති දෙකකට අධික කාලයක් පවත්වන ලද තෙවනවාරය. ආසියානු ශාන්තිකර විශ්වවිද්‍යාලයේ මහාචාර්යය ෆිලිප් පාඩෝ මහතා විසින් පවත්වන ලදී.

60 කට අධික පීඨ කාර්යමණ්ඩල සාමාජිකයින් සාමුහිකව මෙම වැඩසටහන් සඳහා සහභාගී විය.

මුල් වාර දෙක 2011 ජුලි 4 සහ අගෝස්තු 5 දිනයන්හී පවත්වන ලද අතර තුන්වන වාරය පවත්වන ලද්දේ 2011 සැප්තැම්බර් 4 සිට 26 දක්වා වේ.

හෝටල් පාසල් කළමනාකරණය

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය උදෙසා අදියර දෙකකින් සමන්විතව මෙය පවත්වන ලදී. මෙහි සමස්ථ අරමුණ වූයේ ලෝක ප්‍රසිද්ධ ලෙස ඉතා උසස් මට්ටමින් පවත්වන සංචාරක ආයතන කළමනාකරණය කරන්නේ කෙසේද? යන්න ගැන අවබෝධයක් ලබාදීමයි. එහි පළමු වැඩසටහන ඕස්ට්‍රේලියාවේ සල්ස්බර්ග් විශ්වවිද්‍යාලයේ සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ පීඨාධිපති මහාචාර්ය ලෙනාඩ් වොන්ඩිල් විසින් පවත්වන ලදී.

මෙම වැඩසටහන හෝටල් පාසල් කළමනාකරණයට අදාළව විෂයමාලා සංවර්ධනය, ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඇගයීම් සහ ප්‍රතිචාර යන කොටස්වලින් යුක්ත විය. වැඩසටහන 2011 ජුලි 18 දින සිට 22 දක්වා පවත්වන ලදී.

ජ්‍යෙෂ්ඨ හෝටල් කලමනාකරණය

මෙම වැඩසටහන මහාචාර්ය පෝල් පෙන්හෝල්ඩ් මහතා විසින් මෙහෙයවන ලදී. කලින් හොං කොං පොලිටෙක්නික් විශ්විද්‍යාලයේ සේවය කළ ඔහු දැනට වියට්නාමයේ ආගන්තුක සත්කාරය පිළිබ!ද ජාත්‍යන්තර පාසලේ අධ්‍යයන අධ්‍යක්ෂ ලෙස සේවය කරයි. 2009 හොං කොං පොලිටෙක්නික් විශ්වවිද්‍යාලය විසින් පිරිනමන ලද ඉගැන්වීමේ සහ ඉගෙනීමේ නව්‍යකරණයන් පිළිබඳ සම්මානය පළමු වරට දිනාගන්නා ලද්දේ ද ඔහු විසිනි. හෝටල් පාසලේ සහසම්බන්ධතා අනුව තත්ත්ව කළමනාකරණ ක්‍රමවේදයන් පිළිබඳ දැඩි අවධානය යොමුකරන ලදී. ඔහු විසින් මෙහෙයවන ලද වැඩසටහන 2011 ඔක්තෝබර් 17 සිට 21 දක්වා පවත්වන ලදී.

හෝටල් කළමනාකරණ සහ අමුත්තන් පිළිගැනීමේ මෙහෙයුම්

මෙම වැඩසටහන මෙහෙයවූයේ Ritsumeikan ආසියානු ශාන්තිකර විශ්විද්‍යාලයේ මහාචාර්ය K Tajeddini මහතා විසිනි. හෝටල් කළමනාකරණයට අදාළව අමුත්තන් පිළිගැනීමේ මෙහෙයුම පිළිබඳව දෙවන සතිය තුළදී අවධානය යොමුකරන ලදී. 2011 අගෝස්තු 8 සිට 20 දක්වා කාලය තුළදී පවත්වන ලද අතර මේ සඳහා ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ කථිකාචාර්යවරුන් මෙන්ම සංචාරක ක්ෂේත්‍රයේ එම විෂයයට අදාළ කථිකාචාර්යයවරුන් ද සහභාගී වන ලදී.

ජපන් ආහාර සැකසීම සහ ආපනශාලා කළමනාකරණය

ජපානයේ ක්‍යොටෝ ප්‍රදේශයේ සාම්ප්‍රදායික ජපන් ආහාර පිළිබඳ විශේෂ දැනුමැති ජපන් සූපවේදියෙකු විසින් මෙම වැඩසටහන මෙහෙයවන ලදී. තකාෂි ටකුජි මහතා ජපානය පුරා ශාඛා ඇති ක්‍යොටොහි පිහිටි ප්‍රධාන ජපන් අවන්හලේ අයිතිකරු වේ. එමෙන්ම ජපාන ජාතික රූපවාහිනී නාලිකාවේ ද ඔහු සූපවේදියෙකු ලෙස පෙනී සිටී. මීට අමතරව ඔහු ජපන් ඉකබානා කලාවල කිමොනා සැකසීම මෙන්ම ජපන් අවන්හල් මෙහෙයවීම සඳහා අත්‍යාවශ්‍ය වෙනත් දේ පිළිබඳ කාර්යයන් ද සිදුකරනු ලබයි.

මෙම වැඩසටහන සඳහා මසක පමණ කාලයක් ගත වූ අතර අවසන් දිනයේදී ජපන් සූපවේදීන්ගේ මඟපෙන්වීම යටතේ සහභාගී වූවන් විසින් සකස්කරන ලද ආහාර රස වි!දීම සඳහා පැමිණි සිටි අමුත්තන්ට ද ආරාධනා කරන ලදී. තකාෂි මහතා විසින් ලබා ඇති කීර්තිය නිසා ශ්‍රී ලංකාවේ ජපන් තානාපතිවරයා විසින් ඔහුගේ විශේෂ අමුත්තන් පිරිසක් සඳහා රාත්‍රීආහාරවේලක් සකසාගැනීම සඳහා ද ආරාධනා කරන ලදී.

චාරිකා මඟපෙන්වීම්

චාරිකා මඟපෙන්වීමේ TOT වැඩසටහන මහාචාර්ය කාසිම් වෆධරි විසින් මෙහෙයවන ලදී. ඔහු රිට්සුමේකන් ආසියානු පැසිෆික් විශ්වවිද්‍යාලයේ සහකාර මහාචාර්යවරයෙකු වන අතර ජපානයේ සහ මැදපෙරදි චාරිකා මඟපෙන්වීමේ මෙහෙයවන්නන් සඳහා මඟපෙන්වනු ලබයි. චාරිකා මඟපෙන්වීමේ ප්‍රධාන කථිකාචාර්යවරුන් සහ හෝටල් පාසලේ පීඨ සාමාජිකයින් ඒ සඳහා සහභාගී විය. චාරිකා මෙහෙයවීමේ වැඩසටහන සති දෙකක පුහුණු සැසියකින් ආවරණය විය.

ජපන් සංස්කෘතිය සහ ආගන්තුක සත්කාරය

ජපන් ජාතික සංචාරකයින් පිළිබඳ ඉතා හොඳ අවබෝධ කරගැනීමක් උදෙසා සංචාරක ක්ෂේත්‍රයේ ශ්‍රී ලාංකීය පීඨ සඳහා මෙම වැඩසටහන පවත්වන ලදී. මෙහිදී අවධානය යොමුකරන ලද්දේ ජපන් සංචාරකයින්ගේ විවිධ කොටස් හඳුන්වාදීමට සහ විදෙස් සංචාරවලදී ඔවුන්ගේ බලාපොරොත්තු මොනවාද? යන්න හඳුන්වාදීමටත්ය. ඔවුන් කැමති දේශාන්ත පිළිබඳව ද මෙහිදී සාකච්ජා කරන ලදී. මෙම වැඩසටහනේ අවසන් දිනයේදී සියල්ලන්ම ක්ෂේත්‍රචාරිකාවකට සහභාගී කරගන්නා ලදී.

ආහාර පාන

මෙම වැඩසටහන ඕස්ට්‍රේලියාවේ විලියම් ඇන්ල්ගිස් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ඇෂ්ලි නුගෙන්ට සහ ජිම් අර්නවින් විසින් මෙහෙයවන ලදී. කලාපයේ ආහාරපාන සිද්ධාන්තයන් යොදාගන්නේ කෙසේද? යන්න පිළිබඳව මෙහිදී අවධානය යොමුකරන ලදී.

විෂයමාලා සංවර්ධනය කිරීමේ සංරචකය

ව්‍යාපෘතියේ ප්‍රධානතම අරමුණ වුයේ මෙයයි. ශ්‍රී ලංකාවේ පැවැති යුද්ධය අවසන් වීමත් සමඟ බොහෝ කලකට පසු පෙර නොවූ පරිදි සංචාරකයින් මෙරටට පැමිණීමේ වැඩිවීමක් ඇති විය. ඒ අනුව කෙෂ්ත්‍රය සඳහා තත්ත්වයෙන් උසස් මානව සම්පත් අවශ්‍යතාවයක් සඳහා ක්ෂණික ඉල්ලුමක් ඇතිවන ලදී. ඒ වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සංචාරක සහ ආගන්තුක සත්කාරය පිළිබඳ ආයතනය වන ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ භාවිත වන විෂයමාලාව පිළිබඳ නිරීක්ෂණය කිරීම අවශ්‍යතාවයක් විය. 1990 අගභාගයේදී පමණ සංවර්ධනය කරන ලදී. දැනට පවතින විෂයය මාලාව කර්මාන්තයේ වරින් වර සිදුකරන ලද මැදිහත්වීම් මුල්කරගනිමින් ක්‍රමානුකූළ නොවූ වෙනස්කම්වලට භාජනයකර ඇත. කෙසේවෙතත් ආසියාවේ වේගයෙන් දියුණුවන මෙම කර්මාන්තයේ අභියෝගාත්මක ඉල්ලීම් ව්‍යුහාත්මක විෂයමාලා හා පෙන්නුම් නොකරයි.

ඒ අනුව, මෙම සංරචකය ප්‍රධාන විෂයය මාලාවේ පහත සඳහන් විෂයයන් එකොළහක් සංවර්ධනය කිරීමට යොමුකරන ලදී.

1. ගෘහපාලනය (C/D)
2. අමුත්තන් පිළිගැනීමේ මෙහෙයුම් (C/D)
3. ආහාර පාන (Cr/C/D)
4. වෘත්තීය සුප ශාස්ත්‍රය (Cr/C/D)
5. සංචාරක කළමනාකරණය (Cr/C/D)
6. රැස්වීම්, දිරිගැන්වීම්, සම්මේලන සහ ප්‍රදර්ශන සංවරණය (D)
7. සංචාරක මඟපෙන්වීම (C/D)
8. ස්පා සහ විවේකී සංචාරක කළමනාකරණය (C/D)
9. චාරිකා කළමනාකරණය (C/D)
10. ප්‍රජා මූලික සංවරණය (D)

ව්‍යාපෘතියේ මෙම සංරචකයට අනුව ශිල්පීය (Cr) සහතික පත්‍ර(C) සහ ඩිප්ලෝමා (D) වැඩසටහන් සංවර්ධනය කරන ලදී. එසේම මේ යටතේ සංවර්ධන කරනලද රැස්වීම්, දිරිගැන්වීම්, සම්මේලන සහ ප්‍රදර්ශන සංවරණය ස්පා සහ විවේකී සංචාරක කලමනාකරණය, ප්‍රජා මූලික සංවරණය සහ බේකරි විෂයයන් වර්තමානයේ මෙම හෝටල් පාසල මඟින් උගන්වනු නොලැබුවත් එම විෂයයන් සංචාරක කර්මාන්තයට විශාල වශයෙන් වැදගත්වනු ඇත.

මෙම විෂයමාලා සංවර්ධන සඳහා ඔස්ට්‍රියාවේ සල්ස්බර්ග් විශ්වවිද්‍යාලයේ, හොං කොං පොලිටෙක්නික් විශ්වවිද්‍යාලයේ, ඔස්ට්‍රේලියාවේ විලියම් ඇංග්ලිස් විශ්වවිද්‍යාලයේ සහ ජපානයේ රිට්සුමේකන් විශ්වවිද්‍යාලයේ නියෝජිතයින් සාමූහික වගකීම් උසුලන ලදී.

මෙහි මුලාරම්භයන් විවිධ විශ්වවිද්‍යාලයන්හී විවිධ විශේෂඥවරුන් හරහා ආසියානු ශාන්තිකර විශ්වවිද්‍යාලයේ උප සභාපති මහාචාර්යය මැල්කම් කුපර් මහතා විසින් සම්බන්ධීකරණය කරන ලදී.

රිට්සුමේකන් ආසියානු ශාන්තිකර විශ්වවිද්‍යාලයේ හිටපු සභාපති මහාචාර්ය මොන්ටේ කාසිම් මහතා සහ රිට්සුමේකන් භාරයේ උප කුලපති ව්‍යාපෘතියේ මෙම සංරචකය සඳහා ප්‍රතිපත්තිමය මඟපෙන්වීම ලබාදෙන ලදී.

මෙම විෂයමාලා සංවර්ධනය සඳහා ක්‍රමවේදය යොදාගැනීම අනෝන්‍ය ළඟාවීමකි. ඒ අනුව එහි මූලික පියවර ලෙස විෂයානුපථ අධ්‍යයනය හැඳින්විය හැක. ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය විසින් මෙහෙයවූ මෙම අවස්ථාව සඳහා විශ්වවිද්‍යාල පහම සහභාගිවන ලදී. මෙම විෂයානුපථ අධ්‍යයනයේ ආරම්භක වාර්තාව ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය විසින් සංවර්ධනය කර අනුමත කර ඇත. මෙම ආරම්භක වාර්තාව හරහා විෂයයන්ට ඍජුව සහ වක්‍රව අදාළ වන පාඨමාලා හඳුනාගන්නා ලදී.

විෂයමාලා සංවර්ධනයේ ඊළඟ පියවර ලෙස උපදේශකයින්ගේ නිර්දේශ මත සෑම විෂය පථයක් සඳහාම පරතර විශ්ලේෂණයක් සිදුකරන ලදී. මේ සඳහා විෂයානුපථ අධ්‍යයනයේදී එකතු කරගන්නා ලද තොරතුරු මෙන්ම ලෝකව්‍යාප්ත මෙවන් විෂය පථයන් සඳහා ඉදිරිපත්කර ඇති වැඩසටහන් මුල්කර ගනිමින් මෙම පරතර විශ්ලේෂණය සිදුකර ඇත.

මෙම පරතර විශ්ලේෂණය හරහා විෂයමාලා දළ සැලැස්ම, විස්තරාත්මක විෂයමාලාව සහ විෂය සැලැස්ම සංවර්ධනය කරන ලද අතර මෙම ලියකියවිලි කාලානුරූපව හෝටල් පාසල මඟින් ලබාගනී.

වර්තමානයේ විෂයමාලා සංවර්ධනය එහි අවසන් අදියර වෙත ළඟාවී ඇත. සියලුම විෂයයන් එකොළහ සඳහා පාඩම් සැලැස්ම හෝටල් පාසල විසින් ලබාගෙන ඇත.

මෙම ක්‍රමවේදයේ ඊළඟ පියවර ලෙස ක්ෂේත්‍රපරීක්ෂාව හැඳින්විය හැක.

පාඩම් සැලැස්ම අවසන් අදියර ලෙස ගුරු උපකාරක පොත සහ ශිෂ්‍ය අත්පොත සංවර්ධන කරන ලදී. මෙම ලේඛනයන්හී ප්‍රධාන සංරචයකන් පාඩම් සැලස්ම සහ විස්තරාත්මක විෂයමාලා වනු ඇත.

මෙම මූලාරම්භය අනුගමනය කරමින් ශාඛා පාසල්හී ශිෂ්‍යයින් අතර බෙදා හැරීම හරහා මෙම විෂයමාලාව ප්‍රමිතිකරණය කිරීමට අදහස්කර ඇත. හෝටල් පාසල විසින් භාවිතා කිරීමට නියමිත විධිමත් පාඩම් උසස්කරන අතර සංවර්ධනය කරන ලද විෂයමාලා නිර්දේශ කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග දැනටමත් ගෙන ඇත.

සංචාරක කර්මාන්තය සඳහා පුහුණුව

මේ යටතේ පුහුණු වැඩසටහන් 4 ක් පවත්වන ලදී. ඉන් එක් වැඩසටහන් කොළඹ දී පවත්වන අතරතුර ඉන් තුනක් පිටපළාත්වල පවත්වන ලදී. එහි විස්තර පහත දක්වා ඇත.

වැඩසටහන	ස්ථානය	සම්පත් දායකත්වය
සංචාරක කළමනාකරණය	කොළඹ	මහාචාර්යය පැට්‍රීෂියා අර්ෆර්ට්, ජපානයේ රිට්සුමිකන් ආසියානු ශාන්තිකර විශ්වවිද්‍යාලය
හෝටල් කළමනාකරණය සහ ආහාර පාන	අනුරාධපුරය	මහාචාර්ය ඇශ්ලි නැගෙන්ට්, ඕස්ට්‍රේලියාවේ ඇන්ග්ලිස් විශ්වවිද්‍යාලය
ජපන් සංස්කෘතිය සහ සංචාරක චර්යාව	මීගමුව	මහාචාර්ය ටොඩොරොකි, හිරෝෂි ජපානයේ රිට්සුමිකන් ආසියානු ශාන්තිකර විශ්වවිද්‍යාලය
හෝටල් කළමනාකරණය - අමුත්තන් පිළිගැනීමේ මෙහෙයුම්	නුවරඑළිය	මහාචාර්ය ප්‍රකාශ් චනොත්, හොං කොං පොලිටෙක්නිකත් විශ්විද්‍යාලය

ප්‍රවේශ සුදුසුකම්

සහතික පත්‍රපාඨමාලාව

වයස අවුරුදු 18- 30

දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි විෂයය ඇතුළුව විෂයයන් 6 ක් සහිතව අ.පො.ස. (සා/පෙළ) සමත් වීම.

අන්තර් මධ්‍යම පාඨමාලාව

මාස 6 බැගින් වූ කාර්මික පළපුරුද්ද සහිතව සහතික පත්‍ර පාඨමාලා දෙකක් සම්පූර්ණ කර තිබීම හෝ සුපරීක්ෂණ මට්ටමේ අවුරුදු 5 ක පළපුරුද්ද.

උසස් පාඨමාලාව

අන්තර් මධ්‍යම පාඨමාලාව සාර්ථකව නිමකිරීම

ආගන්තුක සත්කාරය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

අ.පො.ස. (උ/පෙළ) විෂයයක් ලෙස ඉංග්‍රීසි විෂයය ඇතුළුව විෂයයන් දෙකක් සමත්වීම. ශිල්පීය

පාඨමාලා අ.පො.ස. (සා/පෙළ) දක්වා අධ්‍යාපනය ලබා තිබීම.

චාරිකා සහ සංචාරක

චාරිකා සහ සංචාරක ඩිප්ලෝමා පාඨමාලාව

අ.පො.ස. (උ/පෙළ) විෂයයන් දෙකක් සහ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි ආයතනයක අඩුම වශයෙන් අවුරුද්දක පළපුරුද්ද හෝ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි ආයතනයක අවුරුදු 3 ක පළපුරුද්ද සහ ඉංග්‍රීසි, භූගෝලය සහ පරිගණක හැකියාව පිළිබ!ද මනා දැනුම.

ජාතික සංචාරක මාර්ගෝපදේශක වැඩසටහන

එක්වරකදී අ.පො.ස. (උ/පෙළ) විෂයයන් 2 ක් සහිතව සමත්වීම හෝ විෂයයන් 6 ක් සහිතව අ.පො.ස. (සා/පෙළ) සමත්වීම.

දෙවාරයකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් තිබීම සහ රියදුරු සංචාරක මාර්ගෝපදේශකවරයෙකු ලෙස අවුරුදු තුනක පළපුරුද්ද.

රියදුරු සංචාරක මාර්ගෝපදේශක වැඩසටහන

එක්වරකදී අ.පො.ස. (උ/පෙළ) විෂයයන් 2 ක් සහිතව සමත්වීම හෝ දෙවාරයකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව අ.පො.ස. (සා/පෙළ) විෂයයන් 6 ක් සමත්වීම.

ප්‍රාදේශීය මඟපෙන්වන්නන්

අ.පො.ස. (සා/පෙළ) දක්වා අධ්‍යාපනය ලබා තිබීම.

වර්තමානයේ පවතින වැඩසටහන්		
වැඩසටහන	කාලය	වැඩසටහන් ගාස්තු (මාසික)
සහතික පත්‍රපාඨමාලාව		
සූපවේදී	මාස 5	රු. 3,500.00
අවන්හල් සහ බීම හල් සේවය	මාස 5	රු. 3,000.00
අමුත්තන් පිළිගැනීම	මාස 5	රු. 3,000.00
ගෘහ පාලනය	මාස 5	රු. 3,000.00
අන්තර් මධ්‍යම පාඨමාලාව		
වෘත්තීය සූප ශාස්ත්‍රය	මාස 5	රු. 4,100.00
අවන්හල් සහ බීම හල් සේවාව	මාස 5	රු. 3,500.00
අමුත්තන් පිළිගැනීම	මාස 5	රු. 3,500.00
ගෘහ පාලන කළමනාකරණය	මාස 5	රු. 3,500.00
උසස් පාඨමාලාව		
වෘත්තීය සූප ශාස්ත්‍රය	මාස 3	රු. 4,100.00
අවන්හල් සහ බීම හල් සේවය	මාස 3	රු. 3,500.00
නවාතැන් කළමනාකරණ මෙහෙයුම්	මාස 3	රු. 3,500.00
ආගන්තුක සත්කාර කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව	අවු 3	රු. 5,700.00
ශිල්පීය පාඨමාලා		
සූපවේදී	මාස 3	රු. 3,500.00
අවන්හල් සහ බීම හල් සේවය	මාස 3	රු. 3,000.00
අමුත්තන් පිළිගැනීම	මාස 3	රු. 3,000.00
ගෘහ පාලනය	මාස 3	රු. 3,000.00
චාරිකා සහ සංචාරක		
චාරිකා සහ සංචාරක ඩිප්ලෝමා පාඨමාලාව	අවු 2	රු. 60,000.00
ජාතික සංචාරක මඟපෙන්වන්නන්	මාස 4	රු. 45,000.00
රියදුරු සංචාරක මඟපෙන්වන්නන්	මාස 3	රු. 30,000.00
ප්‍රාදේශීය මඟපෙන්වන්නන්	මාස 3	

අධ්‍යයන කාර්ය සාධනය

හෝටල් සහ කේටරින් මෙහෙයුම් පිලිබඳ සිව් අවුරුදු කළමනාකරණ ඩිප්ලෝමාව

උසස් පාඨමාලාව

අන්තර් මධ්‍යම පාඨමාලාව සම්පූර්ණ කර තිබීම

උසස් පාඨමාලාව

උසස් පාඨමාලාව

මාස 03

- වෘත්තීය සූප ශාස්ත්‍රය
- ආහාර පාන මෙහෙයුම්
- නවාතැන් කළමනාකරණ මෙහෙයුම්

අන්තර් මධ්‍යම පාඨමාලාව

අදාල කාර්මික පුහුණුව සමඟ වසර 4 ක සහතික පත්‍ර පාඨමාලා

අන්තර් මධ්‍යම පාඨමාලාව

අන්තර් මාධ්‍යම පාඨමාලාව

මාස 06

- වෘත්තීය සූප ශාස්ත්‍රය
- අවන්හල් සහ බීමහල් සේවය
- අමුත්තන් පිළිගැනීම
- ගෘහ පාලනය

සහතික පත්‍ර පාඨමාලාව

වයස අවුරුදු 17 - 30 අතර අ.පො.ස. (සා/පෙළ) විෂයයන් 6 ක් සමත්

හෝ

ශිල්පීය පාඨමාලාව සහ අවුරුදු 2 ක අදාල කාර්මික පළපුරුද්ද

සහතික පත්‍ර පාඨමාලාව

සහතික පත්‍ර පාඨමාලාව

මාස 05

- සූප ශාස්ත්‍රය
- අවන්හල් සහ බීමහල් සේවය
- අමුත්තන් පිළිගැනීම
- ගෘහ පාලනය

පුහුණු කිරීමේ පහසුකම්

තත්ත්වයෙන් උසස් නිෂ්පාදනයක් එළිදැක්වීම පායෝගික හා තාක්ෂණිකව දියුණු පහසුකම්, උසස්කරන ලද විෂයමාලා අඛණ්ඩව පවත්වාගෙන යාම සහ ආයතනයේ විශ්වාසනීයත්වය හරහා ජාතිය සඳහා නිරන්තර සේවාව.

සිසුන්ගේ ප්‍රතිඵල නිකුත් කිරීමට ප්‍රථම ඔවුන් සඳහා බොහෝ රැකියා අවස්ථා උදාවේ. ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ නිෂ්පාදනය පිළිබඳ ඇති ඉල්ලුම පෙන්විය හැකි විශාලම සාක්ෂිය වන්නේ සෑම පාඨමාලාවක අවසානයේ සංචාරක කර්මාන්තයේ පවතින පුරප්පාඩු සඳහා සිසු සිසුවියන් ඉල්ලා සිටීමය.

තුන් අවුරුදු සහ සිව් අවුරුදු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලා සම්පූර්ණ කිරීමෙන් පසු රැකියා වියුක්තිය ශුන්‍ය මට්ටමේ පවතී.

සිසුන් වෙනුවෙන් ලබාදී ඇති පහසුකම්වලින් කිහිපයක් පහත පරිදි වේ.

- පුහුණු මුළුතැන් ගෙවල් 2 ක්
- පුහුණු අවන්හල්
- පුහුණු බීම හලක්
- ගෘහ පාලන නිදර්ශක කාමරයක්
- පුස්තකාලයක්
- අමුත්තන් සඳහා කාමර 12 ක්, පුහුණුවීම සඳහා සමුද්‍රා හෝටලය
- පරිගණක 30 කින් සමන්විත පරිඝණක විද්‍යාගාරයක්
- එක් කාමරයක් සිසුන් 30 දෙනෙකුට පහසුකම් සහිත පංති කාමර 15 ක්
- සිසුන් දෙදෙනෙකුට සරිලන ලෙස ඉඩ පහසුකම් සහිත මේස (4' x25.)
- සිසුන්ගේ අවශ්‍යතා සඳහා කාමර පහසුකම්
- සිසුන් සඳහා ආපනශාලා පහසුකම්
- ශිෂ්‍ය ක්‍රීඩා සහ සුභසාධන සංගමය

ශ්‍රීලංකාවේ පුද්ගල රැකියා සහ හෝටල් කළමනාකරණය සාමාන්‍යයෙන් 90% ක් මෙම ගෞරවාන්විත ආයතනය හරහා බිහිවන්නකි.

පුස්තකාලය

පරිගණක විද්‍යාගාරය

විනෝදාස්වාද පහසුකම්

ශ්‍රවණාගාරය

ගෘහපාලන පුහුණුව

අවන්හල් පුහුණුව

අනුබද්ධ පිළිගත් වෙනත් දේශීය/විදේශීය විශ්වවිද්‍යාල සහ ආයතන

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ කථිකාචාර්යවරුන්ගෙන් කිහිප දෙනෙක් ශ්‍රීලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් සහ රුහුණු විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධි සුදුසුකම් ලබා ඇති අතර සමහරක් කොළඹ සහ රුහුණු විශ්වවිද්‍යාලවල එය හදාරනු ලබයි.

- ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම
- මැලේසියාවේ එම්. එස්. යූ. විශ්වවිද්‍යාලය
- වෘත්තීය සහ ශිල්පීය මට්ටම පිළිවෙළින් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 4 සහ 3 ට සමානවීම

ආධුනිකත්ව පුහුණුව

සහතික පත්‍ර පාඨමාලාව හදාරණු ලබන සෑම ශිෂ්‍යයෙකුම හෝටල් පාසලේ සිව් අවුරුදු වැඩසටහනට යොමුකරවන අතර පිළිගත් හෝටලයක අඩුම වශයෙන් මාස 6 කින් යුතු පුහුණුව අදාළ ක්ෂේත්‍ර දෙකක් සඳහා ලබා සිටිය යුතුය. කාර්මික සේවය ගැන සොයාබැලීම විධිමත් ආකාරයකට සිදුකරනු ලබයි. ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය සියලුම හෝටල් සමඟ ඉතා සමීප සම්බන්ධතාවන් පවත්වන අතර ඒ අනුව, සමීප පරීක්ෂාවන් සඳහා ලිඛිත සහ පුද්ගලික සොයාබැලීම් සිදුකරනු ලබයි.

සහතික පත්‍රපාඨමාලාව

සේවායෝජක විසින් එවනු ලබන රහස්‍ය වාර්තාව පාඨමාලාව සඳහා නැවත ඇතුළත් වීමට විධි නියෝග යවනු ඇත. පෙර මුද්‍රිත පෝරමයක් ශිෂ්‍යයින් වෙත ලබාදෙනු ලබන අතර එය සේවායෝජකයා විසින් පුරවා රහසිගතව ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ ලේඛකාධිකාරී වෙත එවිය යුතුය.

කළමනාකරණ පාඨමාලාව

දෙපාර්ශවයෙන්ම නඩත්තු කළ යුතු කුඩා පොතක් ශිෂ්‍යයා වෙත ලබාදෙන අතර කාර්යය භාර කථිකාචාර්යවරයා විසින් පුද්ගලිකව සිදුකරනු ලබන පැමිණීම් හරහා සිසුන් ලබාගන්නා පුහුණුවේ තත්ත්වය පිළිබඳ සොයා බලනු ලැබේ.

වෘත්තීය සංවර්ධනය

අධ්‍යයන කාර්යය මණ්ඩලය සුදුසුකම් සහිත කථිකාචාර්යවරුන් 45 දෙනෙකුගෙන් සමන්විතය. වර්තමානයේ කථිකාචාර්යවරුන් 10 දෙනෙකු දේශීය මෙන්ම විදේශීය විශ්වවිද්‍යාලවල ආචාර්ය උපාධි හදාරනු ලබයි.

හෝටල් පාසලේ ඩිප්ලෝමා පාඨමාලාව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයක ආචාර්ය උපාධිය සඳහා වන පෙර සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගනු ලබයි.

හෝටල් පාසලේ බොහෝ පීඨ සාමාජිකයින් අවුරුදු කිහිපයක්ම ක්ෂේත්‍රයේ පලපුරුද්ද ඇති එම පාසලේම උපාධිධාරීන් වේ. එසේම දැනුම සහ හැකියාවන් දියුණුකරගැනීම සඳහා විදේශ පළපුරුද්ද ලබා ඇත.

පුහුණුකරවන්නන් පුහුණුකිරීම, අධ්‍යයන පීඨයන්හී ඉගැන්වීමේ ක්‍රමවේදයන්ගේ තත්ත්වය උසස් කිරීම සඳහා පවතින ක්‍රමවේදයකි. අලුතින් බඳවාගන්නා සාමාජිකයින් සඳහා පංතිකාමර කළමනාකරණය, පාඩම් සැලසුම සහ අරමුණු මත පුහුණුව ලබාදේ. ඔවුන් සඳහා අංශ ප්‍රධානීන්ගේ හෝ පාදේශීය පාසල්වල විදුහල්පතිවරුන්ගේ අධීක්ෂණය යටතේ මගපෙන්වනු ලබයි.

අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා දකුණු කැරොලිනාවේ අධ්‍යාපන ආයතනයක් වන ලොව කීර්තිමත් ඇමරිකානු හෝටල් සහ ලැගුම් සංගමයේ සහතිකලද ආගන්තුක සත්කාරක අධ්‍යාපනවේදියා යන ගෞරවාන්විත සුදුසුකම ලබාගැනීමට ද හැකියාව ඇත. මෙය ලොව ඇති ආගන්තුක අධ්‍යාපනවේදීන් සඳහා වන එකම සහතිකයයි.

හෝටල් පාසල යටතේ බඳවාගත් පීඨ කාර්ය මණ්ඩලය සඳහා විෂයමාලා සංවර්ධනය සහ හැකියාව ගොඩනැංවීම ප්‍රධාන සංරචකයක් වේ. මේ යටතේ කථිකාචාර්යවරුන් 10 දෙනෙකු විදෙස් පුහුණු ලබා ඇත. (එක්සත් රාජධානිය, ස්පාඤ්ඤය, චීනය, ඉන්දියාව, නේපාලය සහ තායිලන්තය)

පාඨමාලා විස්තර

පාඨමාලා ප්‍රධාන පුහුණු අංශ 4 ක් යටතේ සිදුකරනු ලබයි. එනම් අමුත්තන් පිළිගැනීම, වෘත්තීය සූපශාස්ත්‍රය, අවන්හල් සහ බීම හල් සේවය සහ හෝටල් ගෘහපාලනය වේ. දේශන, සාකච්ඡා, කණ්ඩායම් කාර්යයන්, තනි තනි කාර්යයන්, කණ්ඩායම් පුහුණු, භූමිකා නිරූපනය සහ සම්මුඛ පරීක්ෂණ යන ක්‍රමවේද හරහා සිදුකරනු ලබයි.

2011 වසරේදී ශිෂ්‍යයින්ට 1,866 දෙනෙකු උසස්, අන්තර් මධ්‍යම, කළමනාකරණ, සහතික පත්‍ර සහ ශිල්පීය පාඨමාලා හදාරා ඇති අතර එහි සාරාංශය මෙසේ දක්වමු.

මධ්‍යස්ථානය	පාඨමාලාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව
කොළඹ	ශිල්පීය පාඨමාලාව	118
	සහතික පත්‍රපාඨමාලාව	361
	කළමනාකරණ පාඨමලාව	183
	අන්තර් මධ්‍යම පාඨමාලාව	30
	උසස් පාඨමාලාව	36
මහනුවර	සහතික පත්‍රපාඨමාලාව	239
කොග්ගල	ශිල්පීය පාඨමාලාව	105
	සහතික පත්‍රපාඨමාලාව	210
බණ්ඩාරවෙල	ශිල්පීය පාඨමාලාව	20
	සහතික පත්‍රපාඨමාලාව	154
අනුරාධපුර	ශිල්පීය පාඨමාලාව	56
	සහතික පත්‍රපාඨමාලාව	58
රත්නපුර	ශිල්පීය පාඨමාලාව	105
	සහතික පත්‍රපාඨමාලාව	191

මෙම ශිෂ්‍යයින් දේශීය සහ විදේශීය හෝටල්වල රැකියා ලබාගැනීමට හැකියාව ඇති අතර හෝටල් පාසල හා එක්ව ඔවුන්ගේ අධ්‍යයන කටයුතු ඉක්මනින් අවසන් කරනු ඇත.

අපගේ වටිනා කාර්යය මණ්ඩලය

සේවයෙන් විශ්‍රාම ගත් සේවකයින්

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ අවුරුදු 12 ක සේවය සම්පූර්ණ කරමින් සමුද්‍රා හෝටලයේ නේවාසික කළමනාකරු ලෙස සේවය කර වයස අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් පසු ඩී. සී. වික්‍රමසිංහ මහතා සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී. ඔහු 1999 ඔක්තෝබර් 5 වන දින සිට මෙම ආයතනයට සේවය කර ඇති අතර බණ්ඩාරවෙල ප්‍රාදේශීය පාසලේ ගෘහ පාලන කථිකාචාර්යවරයෙකු ලෙස බැඳී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ලෙස උසස්වීම් ලබා පසුව සමුද්‍රා හෝටලයේ නේවාසික කළමනාකාර තනතුර ලබාගන්නා ලදී.

මූල්‍ය ප්‍රකාශන

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන 26

මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශය 27

මුදල් ප්‍රවාහ ප්‍රකාශය 28

ශුද්ධ වත්කම් සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය29

ගිණුම්මය ප්‍රතිපත්තින් 30

සටහන් 30

ශුද්ධ පිරිවැය මෙහෙයුම් 39

ආදායම් සහ වියදම් ප්‍රකාශය - අනුරාධපුර 40

ආදායම් සහ වියදම් ප්‍රකාශය - බණ්ඩාරවෙල 41

ආදායම් සහ වියදව් ප්‍රකාශය - කොළඹ 42

ආදායම් සහ වියදම් ප්‍රකාශය ජ මහනුවර 44

ආදායම් සහ වියදම් ප්‍රකාශය - කොග්ගල 45

ආදායම් සහ වියදම් ප්‍රකාශය - රත්නපුර 46

පුහුණු හෝටලය 47

2011

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2011 දෙසැම්බර් 31 දිනට

අගය රුපියල්

	සටහන	2011	2010 නැවත සකස්කළ
වත්කම්			
ජංගම වත්කම්	03	1,703,739.93	1,652,709.85
ඉන්වෙන්ට්‍රි	04	12,515,510.41	5,175,746.70
තැන්පතු සහ වෙනත් ලැබිය යුතු	05	3,297,313.93	1,794,312.35
ශ්‍රීලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් ලද පාරිතෝෂික		6,992,318.70	6,992,318.70
ශ්‍රි.ල.ස.ස.අ. සහ ශ්‍රි.ල.ස.ප.කා. ලැබිය යුතු	06	52,946,261.02	35,131,356.77
ණය සහ වෙනත්	07	8,363,079.62	7,737,921.66
අත්තිකාරම්	08	675,370.50	1,064,919.65
පූර්ව ගෙවීම්		109,639.47	645,212.17
අතැති සහ බැංකුගත මුදල්	09	99,902,034.36	96,191,949.63
මුළු ජංගම වත්කම්		186,505,267.94	156,386,447.48
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත සහ උපකරණ	02	491,837,152.47	473,777,669.47
අඩුකළා ක්ෂයවීම් සඳහා වෙන්කිරීම්		137,554,535.58	100,774,019.75
ලියාහරින ලද අගය		354,282,616.89	373,003,649.72
එකතුකළා නොනිම් වැඩ		55,889,885.22	9,434,038.22
මුළු ජංගම නොවන වත්කම්		410,172,502.11	382,437,687.94
මුළු වත්කම්		596,677,770. 05	538,824,135.42
වගකීම්			
ජංගම වගකීම්			
තැන්පතු/ වෙනත් ගෙවිය යුතු	10	1,615,371.89	67,500.00
ගෙවිය යුතු ශ්‍රි.ල.ස.ස.අ.ට හා ශ්‍රි.ල.ස.ප.කා.	11	3,934,242.19	4,142,413.79
උපචිත වියදම්	12	16,104,764.63	15,430,001.26
විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	13	10,913,927.50	9,951,947.48
මුළු ජංගම වගකීම්		32,568,306.21	29,591,862.53
ශුද්ධ වත්කම්		564,109,463.84	509,232,272.89
ශුද්ධ වත්කම් හිමිකම්			
ප්‍රාග්ධන දායකත්වය		454,850,951.89	454,850,951.89
ආදායම් ගිණුම		94,717,014.65	39,067,604.93
ප්‍රතිපාදන (ස්ටෙෂර් ඔෆෘප්)		14,541,497.30	15,313,716.00
මුළු ශුද්ධ වත්කම්/ හිමිකම්		564,109,463.84	509,232,272.82

ආචාර්යය නාලක ගොඩහේවා	ජී. එස්. විජේවර්ධන	එස්. එම්. එෆ්. ප්‍රනාන්දු
සභාපති	වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්	වැඩ බලන සහකාර අධ්‍යක්ෂ/ මුදල්

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසරට

අගය රුපියල්

	සටහන	2011	2010 නැවත සකස්කළ
වත්කම්			
සංචාරක සංවර්ධන බදු		71,296,539.38	55,782,684.27
අපගමන බදු		142,431,777.82	117,005,020.31
පාසල් ගාස්තු සහ වෙනත්	14	37,098,776.07	29,108,823.25
වෙනත් අදායම්	15	2,358,948.58	2,134,079.86
හෝටල් අදායම		11,841,591.52	13,155,220.54
මුළු ආදායම		265,027,633.37	217,185,828.23
වියදම්			
වැටුප්, සේවක සහ සේවක ප්‍රතිලාභ	16	73,937,040.01	66,545,916.21
සැපයුම් සහ පාරිභෝගික යෙදවුම්	17	98,232,659.95	73,867,661.91
ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම්	18	36,780,515.83	33,843,414.28
වෙනත් වියදම්	19	275,474.70	1,002,405.30
මූල්‍ය වියදම්	20	152,533.16	267,310.14
මුළු වියදම්		209,378,223.65	175,526,707.84
අතිරික්තය/ (ඌණතාව)		55,649,409.72	41,659,120.39

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය
මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

2011 දෙසැම්බර් 31 දිනට		අගය රුපියල්
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය		55,649,409.72
ශුද්ධ අතිරික්තය/ (ඌනතාව)		
ක්ෂයවීම	36,780,515.83	
පාඩු සහ ලියාහැරීම්	(772,218.70)	
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	1,353,002.60	37,361,299.73
කාරක පාග්ධන වෙනස්වීම්වලට පෙර ක්‍රියාකාරකම්		
මෙහෙයුම් තුළින් මුදල් ප්‍රවාහය		93,010,709.45
කාරක පාග්ධන වෙනස්වීම්		
(වැඩිවීම්)/ අඩුවීම් ඉන්වෙන්ට්‍රි	(51,030.08)	
(වැඩිවීම්)/ අඩුවීම් වෙළඳ ණයගැතියන්	(7,339,763.71)	
(වැඩිවීම්)/ අඩුවීම් විවිධ ණයගැතියන්	(17,814,904.32)	
(වැඩිවීම්)/ අඩුවීම් පූර්ව ගෙවීම්	535,572.70	
(වැඩිවීම්)/ අඩුවීම් ණය සහ අත්තිකාරම්	(228,518.80)	
(වැඩිවීම්)/ අඩුවීම් තැන්පතු ලැබීම්	(1,503,001.58)	
(වැඩිවීම්)/ අඩුවීම් වෙනත් ගෙවියයුතු	1,089,895.48	
(වැඩිවීම්)/ අඩුවීම් උපචිත වියදම්	4,595,197.95	
(වැඩිවීම්)/ අඩුවීම් ගෙවිය යුතු බදු	249,804.81	(20,466,747.55)
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ශුද්ධ මුදල් ප්‍රවාහය		72,543,961.90
ආයෝජන ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ		
පාරිතෝෂික ගෙවීම්	(391,022.58)	
දේපළ, පිරියත සහ උපකරණ මිලදීගැනීම්	(68,442,854.59)	
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වූ ශුද්ධ මූල්‍ය		(68,833,877.17)
ශුද්ධ වැඩිවීම් - මුදල් සහ මුදල් හා සමාන දෑ		3,710,084.73
වසර මුල මුදල් සහ මුදල් හා සමාන දෑ		96,191,949.63
වසර අග මුදල් සහ මුදල් හා සමාන දෑ		99,902,034.36

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය
ශුද්ධ වත්කම්/හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා | අගය රුපියල්

	සටහන	ප්‍රාග්ධන දායකත්වය	සම්මුචිත අතිරික්තය (ඌනතාව)	එකතුව
2010 දෙසැම්බර් 31 දිනට ශේෂය		454,850,951.89	36,083,654.72	490,934,606.61
පූර්ව වර්ෂ ගැළපුම්			2,983,950.21	2,983,950.21
නැවත සකස්කළ ශේෂය		454,850,951.89	39,067,604.93	493,918,556.82
කාලපරිච්ජේදය සඳහා අතිරික්තය/ (ඌනතාවය)			55,649,409.72	55,649,409.72
2011 දෙසැම්බර් 31 දිනට ශේෂය ඉදිරියට ගෙනගියා		454,850,951.89	94,717,014.65	549,567,966.54

සටහන 01

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා මූලික ගිණුම්මය කල්පිතයන් සහ ගිණුම්මය ප්‍රතිපත්තීන්

1.1 ගිණුම්මය අවශ්‍යතාවයන්

ශ්‍රීලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශයන් පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව නිත්‍යවශයෙන් ඓතිහාසික පිරිවැය මත පදනම්ව සකස්කර ඇත. ආදායම් සහ වියදම් අදාළ කාලපරිච්ඡේදයන්ට අනුව මූල්‍ය ප්‍රකාශයන්හී උපචිතගතකර සහ වාර්තාගතකර ඇත. නියමිත මූල්‍ය ප්‍රතිපත්තීන්ට අනුව පසු සටහන්හී විස්තරකර ඇත. ගිණුම් සඳහා බලපාන උද්ධමනීය සාධක සඳහා ගැළපීම් සිදුකර නොමැත.

1.2 ඉන්වෙන්ට්‍රිතොග

තොග සාමාන්‍යයෙන් තක්සේරුකර ඇත්තේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්දි වටිනාකම් මත වේ.

1.3 ක්ෂයවීම්

ක්ෂයවීම් ඉදිරිපත්කර ඇත්තේ වියදම් හෝ පහත සඳහන් සරල රේඛී ක්‍රමය යටතේ වත්කම් තක්සේරුව මත වේ. (සංශෝධිත ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 18 ට අනුව)

1.4 බදුකරණය



1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ වගන්ති 8 (a) (XX) අනුව ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය ආදායම් බද්දෙන් නිදහස්ව ඇත. එනමුත්, දේශීය ආදායම් පනතේ සංශෝධන පනත වන 2002 අංක 10 දරන පනත අනුව සෑම කාර්තුවක් අවසානයේ සෑම මසකම 20 වන දා බදු වාර්තා දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට යැවිය යුතු වේ.

1.5 ඒ. 2005 අංක 38 දරන සංචාරක පනත ක්‍රියාත්මක කිරීම

2007 ඔක්තෝබර් 01 දින සිට 2005 අංක 38 දරණ සංචාරක පනත ක්‍රියාත්මක කරන ලදී. පහත පරිදි නව ආයතන 2007 ඔක්තෝබර් 1 දින සිට නීතිගත කර ඇත.

- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
- ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය
- ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය

බී. සංචාරක සංවර්ධන අරමුදල් බෙදාහැරීම්

සංචාරක පනතේ 23(1) වගන්තියට අනුව සංචාරක සංවර්ධන අරමුදල ශ්‍රීලංකාවෙහි සංචාරක ප්‍රවර්ධනයට සහ අලෙවිකරණයට යොදාගත හැක. එම අරමුදල කළමනාකරණය සහ පාලනය කිරීම ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදුකරනු ලබයි. මෙම සංචාරක සංවර්ධන අරමුදලේ මුළු බෙදාහැරීම් සංචාරක පනතේ 24(8) වගන්තියට අනුව පහත පරිදි සිදු කෙරේ.

අධිකාරිය	බෙදාහැරීමේ ප්‍රතිශතය
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	14%
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය	70%
ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය	12%
ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය	04%

1.6 නොනිම් වැඩ

නොනිම් වැඩවල වටිනාකම ලෙස රු. 55,889,885.22 වැඩ නිම නොවූ පිරිවැය ලෙස දැක්වේ.

1.7 පාරිතෝෂික

1983 අංක 12 දරන විශ්‍රාම පාරිතෝෂික ගෙවීම් පනත යටතේ සියලුම සේවකයින් පාරිතෝෂිකයට යටත්වන සේවකයින් ලෙස ගෙන ඇත.

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය

දේපළ, පිරියත සහ උපකරණ

සටහන 02

2011 දෙසැම්බර් 31 දිනට

ගිණුම් සංකේතය	විස්තරය	2011.01.01 දිනට ශේෂය	ගැළපුම්	2011.01.01 දිනට ශේෂය	එකතු කිරීම්	මාරු කිරීම්	2011.12.31 දිනට ශේෂය	2011.01.01 දිනට සමුච්චිත ක්ෂය	2011 සඳහා ක්ෂයවීම	2011.12.31 දිනට සමුච්චිත ක්ෂය	ශුද්ධ පොත් අගය
102	ගොඩනැගිලි	285,170,885.03		285,170,885.03	-	-	285,170,885.03	34,092,202.63	11,406,835.40	45,499,038.03	239,671,847.00
102C	විද්‍යුත් සවිකිරීම්	1,140,381.00		1,140,381.00	-	-	1,140,381.00	129,221.10	57,019.05	186,240.15	954,140.85
102D	දුරකථන සවිකිරීම්	2,220,359.50		2,220,359.50	150,401.13		2,370,760.63	316,234.24	115,054.27	431,288.51	1,939,472.12
103	සවිකිරීම් සහ වැද්දුම්	2,721,994.30		2,721,994.30	657,912.26	-	3,379,906.56	512,374.81	212,857.54	725,232.35	2,654,674.21
104	ලී බඩු	27,672,407.87	293,750.00	27,966,157.87	2,718,928.97		30,685,086.84	4,867,179.45	2,127,045.16	6,994,224.61	23,690,862.23
105	විවිධ උපකරණ	84,446,081.01	157,566.00	84,603,647.01	9,244,547.12		93,848,194.13	14,714,884.60	6,765,016.91	21,479,901.51	72,368,292.62
106	පිරියත සහ උපකරණ	9,363,591.83		9,363,591.83	-	-	9,363,591.83	6,773,346.92	2,340,897.96	9,114,244.88	249,346.95
107	විදුරු සහ පිඟන් භාණ්ඩ	4,524,729.68		4,524,729.68	397,127.99	-	4,921,857.67	4,031,930.70	412,033.87	4,443,964.57	477,893.10
108	හැඳිගැරුප්පු සහ රිදී භාණ්ඩ	11,949,902.14		11,949,902.14	2,499,850.41	-	14,449,752.55	8,811,997.33	3,602,980.93	12,414,978.26	2,034,774.29
109	රෙදි පිළි	5,941,948.98	20,465.00	5,962,413.98	714,482.79	-	6,676,896.77	5,606,315.79	354,712.86	5,961,028.65	715,868.12
110	මෝටර් රථ	3,820,000.00		3,820,000.00	-	-	3,820,000.00	2,865,000.00	955,000.00	3,820,000.00	-
111	පරිගණක සහ දත්ත සැකසුම් උපකරණ	29,223,064.40	-471,781.00	28,751,283.40	1,533,857.77	-	30,285,141.17	15,616,337.94	7,254,719.73	22,871,057.67	7,414,083.50
118	පුස්තකාල පොත්	896,138.33		896,138.33	-	-	896,138.33	407,550.97	298,682.91	706,233.88	189,904.45
119B	කාර්යාලීය උපකරණ	1,391,575.00		1,391,575.00	-	-	1,391,575.00	227,286.00	139,157.50	366,443.50	1,025,131.50
119C	මුළුතැන්ගෙයි සහ බේකරි උපකරණ	912,021.14		912,021.14	-	-	912,021.14	95,157.74	68,401@59	163,559.33	748,461.81
	පරිගණක වැඩසටහන් සහ මෘදුකාංග	594,130.00		594,130.00	142,374.57	-	736,504.57	365,655.09	222,985.34	588,640.43	147@864@14
100	සංවර්ධන පිරිවැය	1,788,459.25		1,788,459.25	-	-	1,788,459.25	1,341,344.44	447,114.81	1,788,459.25	-
		473,777,669.46	0.00	473,777,669.46	18,059,483.01	0.00	491,837,152.47	100,774,019.75	36,780,515.83	137,554,535.58	354,282,616.89
නොනිමි වැඩ											55,889,885.22
එකතුව											410,172,502.11

නොනිමි වැඩ

විස්තරය		වටිනාකම
111/- CHS	නොනිමි වැඩ - කොළඹ	55,715,005.22
111/- CHS	නොනිමි වැඩ - කොග්ගල	62,560.00
111/- CHS	නොනිමි වැඩ - රත්නපුර	112,320.00
එකතුව		55,889,885.22

තොග ශේෂය

සටහන 03

විස්තරය	2011	2010
මත්පැන් තොග	115,807.44	185,536.96
ප්‍රධාන ගබඩාව	1,587,932.49	1,467,172.89
එකතුව	1,703,739.93	1,652,709.85

වෙළඳ ණයගැතියන්

සටහන 04

විස්තරය	2011	2010
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය	3,128,262.63	2,949,608.02
සංචාරක අමාත්‍යාංශය	4,360,495.90	1,232,233.27
සම්මුති කාර්යාංශය	224,165.87	577,779.42
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	863,709.47	257,449.99
චාරිකා සහ සංචාරක	-	32,975.00
ජාතික සංචාරක ආයෝජන ඒකකය	998,735.14	-
හෝටල් පාසල් උපාධි සංගමය	15,498.25	-
සංචාරක සම්පත් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	1,350,533.78	-
විශ්වවිද්‍යාලය, කොළඹ	1,028,017.59	-
ඩී එක්ස් එන් ශ්‍රී ලංකා	17,000.00	-
සුම්මා ටැවල්ස්	-	7,000.00
ශ්‍රී ලංකා අභ්‍යන්තරික චාරිකා මෙහෙයවන්නන්ගේ සංගමය	45,000.00	41,201.00
ඩී එෆ් සී සී බැංකුව	140,100.00	77,500.00
ජායා බිලු හෝටලය	29,970.00	-
කීල්ස් හොටල් කළමනාකරණ ආයතනය	29,600.00	-
කථනය සහ නාට්‍ය අධ්‍යාපන ආයතනය	12,870.00	-
ගුවන් ගමන් ජාත්‍යාන්තර සේවා ඇකඩමිය	99,253.78	-
ධනන්ජය නන්දසිරි	32,000.00	-
ජාත්‍යාන්තර වෙළඳ ප්‍රදර්ශනය, යාපනය	61,150.00	-
එන් වයි අබේවර්ධන	79,148.00	-
එකතුව	12,515,510.41	5,175,746.70

තැන්පතු සහ වෙනත් ලැබීම්

සටහන 05

විස්තරය	2011	2010
තැන්පතු ලැබීම්	1,794,312.35	1,794,312.35
වෙනත් ලැබීම්	1,503,001.58	-
එකතුව	3,297,313.93	1,794,312.35

ලැබීම් ශ්‍රී.ල.ස.ස.අ. සහ ශ්‍රී.ල.ස.ප්‍ර.කා. - 126K

සටහන 06

විස්තරය	2011	2010
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	52,211,595.20	34,923,593.27
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය	734,665.82	207,763.50
එකතුව	52,946,261.02	35,131,356.77

ණය සහ වෙනත්

සටහන 07

විස්තරය	2011	2010
ආපදා ණය	8,144,669.62	7,479,568.66
විශේෂ ණය	153,410.00	166,853.00
උත්සව අත්තිකාරම්	65,000.00	91,500.00
එකතුව	8,363,079.62	7,737,921.66

අත්තිකාරම්

සටහන 08

විස්තරය	2011	2010
සාමාන්‍ය අත්තිකාරම්	239,500.00	68,500.00
විදෙස් අත්තිකාරම්	435,870.50	996,419.65
එකතුව	675,370.50	1,064,919.65

මුදල් ශේෂය

සටහන 09

විස්තරය	2011	2010
ලංකා බැංකුව - කොළඹ	83,302,587.02	93,511,554.03
ලංකා බැංකුව - මහනුවර	4,796,732.20	266,732.44
ලංකා බැංකුව - බණ්ඩාරවෙල	2,785,312.70	360,247.12
ලංකා බැංකුව - අනුරාධපුර	3,112,179.37	518,295.21
ලංකා බැංකුව - කොග්ගල	2,835,889.82	1,070,581.33
ලංකා බැංකුව - රත්නපුර	3,069,333.25	464,539.50
එකතුව	99,902,034.36	96,191,949.63

තැන්පතු සහ වෙනත් ගෙවිය යුතු

සටහන 10

විස්තරය	2011	2010
ගෙවියයුතු තැන්පතු	142,500.00	67,500.00
ගෙවිය යුතු වෙනත්	1,472,871.89	-
එකතුව	1,615,371.89	67,500.00

ගෙවියයුතු ශ්‍රී.ල.ස.ස.අ. 124K

සටහන 11

විස්තරය	2011	2010
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවියයුතු	3,934,242.19	4,142,413.79
එකතුව	3,934,242.19	4,142,413.79

උපචිත වියදම්

සටහන 12

විස්තරය	2011	2010
කොළඹ	12,781,972.41	13,304,384.20
මහනුවර	1,533,566.37	801,942.68
අනුරාධපුර	451,881.69	368,000.00
කොග්ගල	406,895.03	708,219.10
රත්නපුර	290,466.33	-
බණ්ඩාරවෙල	639,982.80	247,455.28
එකතුව	16,104,764.63	15,430,001.26

විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන්කිරීම්

සටහන 13

විස්තරය	2011	2010
ඉදිරියට ගෙනගිය අගය	9,951,947.48	10,841,343.12
එකතුකළා		
වර්ෂය සඳහා වෙන්කිරීම්	1,353,002.60	1,198,593.67
	11,304,950.08	12,039,936.79
අඩුකළා		
වසර සඳහා ගෙවන ලද අගය	391,022.58	282,552.50
2009 වසරේ වැඩිපුර වෙන්කිරීම්		1,805,436.81
2011.12.31 දිනට ගෙවිය යුතු පාරිතෝෂික	10,913,927.50	9,951,947.48

ප්‍රධාන ආදායම

විස්තරය	2011	2010
සංචාරක සංවර්ධන බදු ආදායම	71,296,539.38	55,782,684.27
අපගමන බදු	142,431,777.82	117,005,020.31
එකතුව	213,728,317.20	172,787,704.58

පාසල් ගාස්තු සහ වෙනත්

සටහන 14

විස්තරය	2011	2010
වෘත්තීය පරීක්ෂණ ආදායම සහ වෙනත්	2,493,299.34	1,455,858ග61
වෙනත් ආදායම් (වරදිවැජඑම) බැකෙඑ)	142,311.62	89,990.25
පාසල් ගාස්තු	27,674,037.66	20,528,336.89
චාරිකා සහ සංචාරක	6,789,127.45	7,034,637.50
එකතුව	37,098,776.07	29,108,823.25

වෙනත් ලැබීම්

සටහන 15

විස්තරය	2011	2010
ගොඩනැගිලි බදු	800,000.00	1,084,621.00
වෙනත් ලැබීම්	1,184,241.71	810,155.56
වෙන්දේසි	39,655.00	-
සේවක ණය පොළිය	335,051.87	239,303.30
එකතුව	2,358,948.58	2,134,079.86

වැටුප්/ වේතන සහ සේවක ප්‍රතිලාභ

සටහන 16

විස්තරය	2011	2010
වැටුප් සහ වේතන	41,606,932.71	40,834,866.77
නිවාඩු දීමනා	275,396.56	224,633.75
අතිරේක පැය සඳහා ගෙවීම්	1,100,687.50	-
අතිකාල	1,390,029.41	964,710.83
සේවක අර්ථසාධක අරමුදල	4,324,941.36	4,471,088.36
සේවක භාරකාර අරමුදල	868,541.21	898,053.49
සේවක සුබසාධන	5,197,752.43	6,388,548.98
සේවක ආහාර සැපයීම්	3,838,495.59	-
සේවක නිල ඇඳුම්	505,951.48	264,917.50
සේවක පාරිතෝෂික	1,353,002.60	-
පැමිණීමේ දීමනා	1,942,360.75	2,199,760.45
සේවක පුහුණු	532,293.11	1,249,403.16
ගමන් වියදම් දේශීය	541,798.68	348,339.50
ගමන් වියදම් විදේශීය	773,753.59	2,114,632.06
බාහිර කථිකාචාර්ය ගාස්තු	9,685,103.03	6,586,961.36
එකතුව	73,937,040.01	66,545,916.21

සැපයුම් සහ පාරිභෝගික යෙදවුම්

සටහන 17

විස්තරය	2011	2010
සංග්‍රහ කටයුතු දේශීය	364,280.35	31,375.50
පවිත්‍රතා සැපයුම්	373,985.85	380,468.00
විවිධ සැපයුම්	17,080,321.72	11,302,464.31
ලිපි ද්‍රව්‍ය	2,978,788.07	3,038,457.85
මුද්‍රණ සහ ප්‍රකාශන	1,745,846.05	1,664,194.65
දුරකථන සහ විද්‍යුත් තැපෑල	4,683,792.81	3,542,210.86
තැපෑල්, මුද්දර සහ විදුලි පණිවුඩ	281,542.56	360,441.09
විදුලිය සහ ගෑස්	18,811,479.69	16,024,235.69
ගාස්තු සහ බලපත්‍ර	767,841.74	1,061,592.53
ස්ථාවර වත්කම් රක්ෂණය	1,113,039.40	864,084.48
ලොන්ඩ්‍රි	798,174.66	588,110.59
ගොඩනැගිලි නඩත්තු	5,912,753.26	2,243,283.61
උපකරණ නඩත්තු	4,124,084.13	3,938,217.29
ප්‍රචාරණය සහ ප්‍රවර්ධනය	3,165,275.57	3,587,163.15
ප්‍රවාහන	95,410.00	245,090.00
කුලී වාහන	7,138,023.15	5,098,142.84
අමුද්‍රව්‍ය	14,839,823.23	13,020,981.12
පොත් පත් සහ සඟරා	1,959,360.64	355,046.06
දත්ත සැකසුම්	95,425.00	3,920.00
වාහන නඩත්තුව සහ අලුත්වැඩියාව	2,510,108.92	271,255.00
බොජුන් පත් සහ මල්	43,003.68	25,454.00
ජලය	1,552,129.81	1,518,420.04
මාර්ගෝපදේශක වැඩසටහන	7,798,169.66	4,703,053.25
එකතුව	98,232,659.95	73,867,661.91

ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම්

සටහන 18

විස්තරය	2011	2010
සවිකිරීම් සහ වැද්දුම්	212,857.53	199,842.69
ලී බඩු	2,127,045.17	1,889,420.47
විවිධ උපකරණ	6,765,016.91	5,182,666.29
පිරියත සහ උපකරණ	2,340,897.96	2,340,897.96
වීදුරු සහ පිඟන් භාණ්ඩ	412,033.87	1,500,284.16
හැඳි ගෑරුප්පු සහ රිදී භාණ්ඩ	3,602,980.94	3,145,810.70
රෙදිපිළි	354,712.85	264,304.13
මෝටර් රථ	955,000.00	955,000.00
දුහුත් සවිකිරීම්	57,019.05	57,019.05
සංවර්ධන පිරිවැය	447,114.81	447,114.81
දුරකථන සවිකිරීම්	115,054.27	111,017.98
පරිගණක දත්ත සැකසුම් උපකරණ	7,254,719.73	5,720,962.83
විවිධ වත්කම් පුස්තකාල පොත්	298,682.91	236,559.37
ගොඩනැගිලි	11,406,835.40	11,386,931.22
පරිඝණක සැකසුම් සහ මෘදුකාංග	222,985.34	198,023.53
කාර්යාලීය උපකරණ	139,157.50	139,157.50
මුළුතැන්ගෙයි සහ බේකරි උපකරණ	68,401.59	68,401.59
එකතුව	36,780,515.83	33,843,414.28

වෙනත් වියදම්

සටහන 19

විස්තරය	2011	2010
ආර්ථික සේවා ගාස්තු	29,312.48	93,341.75
මණ්ඩලීය සභික දීමනා	168,000.00	16,500.00
විගණන ගාස්තු		110,000.00
පාඩු සහ ලියාහැරීම්	61,516.22	-
මහින්ද චින්තන ව්‍යාපෘතිය	16,646.00	782,563.55
එකතුව	275,474.70	1,002,405.30

මූල්‍ය වියදම්

සටහන 20

විස්තරය	2011	2010
බැංකු ගාස්තු	94,332.93	132,913.35
හර බදු	56,962.15	134,396.79
විනිමය වෙනස්කම්	1,238.08	-
එකතුව	152,533.16	267,310.14

හිමිකම් වෙනස්වීම් ප්‍රකාශයේ සඳහන් පරිදි 2010 වසරේ ශුද්ධ අදායම් බලපෑම රු.165,611.55ට අදාළව වියදම්හී වෙනස්කම් අගය නිරූපනයකර ඇති රු.(2,818,338.66) ලෙස ආරම්භක රඳවාගත් ඉපැයීම් රු. 2,983,950.21 ලෙස ගළපා ඇත.

මුල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පෙන්වා ඇති සන්සන්දනාත්මක අගයන් පහත පරිදි නැවත සකස්කර ඇත.

විස්තරය	2010	ගැලපුම්	2010 නැවත සකසන ලද
සංචාරක සංවර්ධන බදු	55,782,684.27		55,782,684.27
අපගමන බදු	117,005,020.31		117,005,020.31
පාසල් ගාස්තු සහ වෙනත්	29,083,904.91	24,918.34	29,108,823.25
වෙනත් ලැබීම්	2,134,079.86		2,134,079.86
හෝටලයෙන් ලැබීම්	13,014,527.33	140,693.21	13,155,220.54
මුළු ආදායම	217,020,216.68	165,611.55	217,185,828.23
වේතන, වැටුප් සහ සේවක ප්‍රතිලාභ	66,845,997.04	(300,080.83)	66,545,916.21
සැපයුම් සහ පාරිභෝජන යෙදවුම්	76,385,919.74	(2,518,257.83)	73,867,661.91
ක්ෂවීම් සහ ක්‍රමක්ෂය වියදම්	33,843,414.28		33,843,414.28
වෙනත් වියදම්	1,002,405.30		1,002,405.30
මුල්‍ය වියදම්	267,310.14		267,310.14
මුළු වියදම්	178,345,046.50	(2,818,338.66)	175,526,707.84
අතිරික්තය/(ඌනතාව)	38,675,170.18	2,983,950.21	41,659,120.39

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය
ශුද්ධ මෙහෙයුම් පිරිවැය සාරාංශය

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා — අගය රුපියල්

	2011 වටිනාකම	2012 වටිනාකම
ශුද්ධ මෙහෙයුම් පිරිවැය		
අනුරාධපුර	(8,820,617.27)	(7,940,961.26)
බණ්ඩාරවෙල	(8,095,154.62)	(8,287,389.79)
කොළඹ	(122,764,101.63)	(105,469,570.45)
මහනුවර	(12,795,454.52)	(10,262,132.77)
කොග්ගල	(11,416,726.67)	(12,627,401.41)
රත්නපුර	(6,363,496.16)	64,347.65
සමුද්‍රා හෝටලය	11,841,591.52	13,155,220.54
මුළු ශුද්ධ මෙහෙයුම් පිරිවැය	(158,413,959.35)	(131,367,887.49)

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය - අනුරාධපුර
ආදායම් සහ වියදම්

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා — අගය රුපියල්

	2011	2010 නැවත සකසන ලද
පාසල් ගාස්තු	1,132,419.00	878,251.96
වෘත්තීය පරීක්ෂණ ආදායම් සහ වෙනත්	188,833.08	455,513.38
වෙනත් ආදායම්	71,532.13	143,774.80
වෙන්දේසි	38,745.00	-
හෝටල් පාසල් අදායම	12,450.00	-
මුළු ආදායම	1,443,979.21	1,477,540.14
අඩු කළා		
පරිපාලන සහ ආයතනික වියදම්	8,745,601.47	8,059,154.61
ක්ෂයවීම්	1,518,995.01	1,359,346.79
ශුද්ධ මෙහෙයුම් වියදම්	(8,820,617.27)	(7,940,961.26)
පරිපාලන සහ ආයතනික වියදම්		
වේතන සහ වැටුප්	2,568,211.40	3,026,446.00
නිවාඩු දීමනා	17,450.19	1,275.00
අතිකාල	17,047.45	23,462.21
සේවක අර්ථසාධක අරමුදල	288,933.56	363,668.64
සේවක භාරකාර අරමුදල	57,786.72	78,696.83
සේවක සුභසාධනය	210,004.50	181,618.10
ගමන් වියදම් - දේශීය	24,286.50	35,845.50
සංග්‍රහ කටයුතු	3,224.00	250.00
පවිත්‍රතා සැපයුම්	4,953.50	3,940.00
විවිධ සැපයුම්	1,397,271.84	1,027,852.05
ලිපි ද්‍රව්‍ය	70,876.87	196,693.00
මුද්‍රණ සහ ප්‍රකාශන	230.00	92,14000
දුරකථන සහ විදුලි තැපෑල	204,018.49	214,294.26
තැපැල්, මුද්දර සහ විදුලි පණිවුඩ	19,907.00	15,86500
විදුලිය සහ ගෑස්	421,301.00	406,732.82
ගාස්තු සහ බලපත්‍ර	-	4,878.88
ලොන්ඩ්‍රි	16,255.00	6,720.00
ගොඩනැගිලි නඩත්තු	107,133.00	165,811.00
කාර්යාලීය උපකරණ නඩත්තු	302,259.12	10,395.00
ප්‍රවාහන	17,610.00	133,075.00
බැංකු ගාස්තු	3,750.00	2,500.00
හර බදු - අනුරාධපුර	1,461.17	-
කුලී වාහන	695,221.42	402,136.00
අමුද්‍රව්‍ය	679,276.50	624,562.52
බාහිර කථිකාචාර්ය ගාස්තු	1,226,630.69	648,933.90
කාර්ය මණ්ඩල පුහුණු	-	45,500.00
පොත් පත් සහ සඟරා	95,317.90	23,550.00
පැමිණීමේ දිරිදීමනා	117,629.75	158,107.50
ජලය	176,203.90	164,205.40
දත්ත සැකසුම්	1,350.00	-
මුළු වියදම්	8,745,601.47	8,059,154.61

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය - බණ්ඩාරවෙල
ආදායම් සහ වියදම්

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා — අගය රුපියල්

	2011	2010 නැවත සකසන ලද
පාසල් ගාස්තු	2,275,462.87	2,217,160.39
වෘත්තීය පරීක්ෂණ ආදායම් සහ වෙනත්	64,545.47	37,864.76
වෙනත් ආදායම්	183,007.07	12,600.00
හෝටල් පාසල් අදායම	4,600.00	-
මුළු ආදායම	2,527,615.41	2,267,625.15
අඩු කළා		
පරිපාලන සහ ආයතනික වියදම්	9,453,768.36	9,339,810.77
ක්ෂයවීම්	1,169,001.67	1,215,204.17
ශුද්ධ මෙහෙයුම් වියදම්	(8,095,154.62)	(8,287,389.79)
පරිපාලන සහ ආයතනික වියදම්		
වේතන සහ වැටුප්	2,413,165.42	3,078,293.87
නිවාඩු දීමනා	9,940.00	7,580.50
අතිකාල	75,641.30	11,452.68
සේවක අර්ථසාධක අරමුදල	235,657.69	368,162.81
සේවක භාරකාර අරමුදල	47,131.53	67,669.46
සේවක සුභසාධනය	117,804.00	152,217.00
ගමන් වියදම් - දේශීය	58,359.00	80,672.00
සංග්‍රහ කටයුතු	4,465.22	7,318.00
පවිත්‍රතා සැපයුම්	3,029.00	-
විවිධ සැපයුම්	1,996,906.35	1,286,794.23
ලිපි ද්‍රව්‍ය	68,788.93	102,785.00
මුද්‍රණ සහ ප්‍රකාශන	3,029.82	24,350.00
දුරකථන සහ විද්‍යුත් තැපෑල	261,635.75	245,192.00
තැපැල්, මුද්දර සහ විදුලි පණිවුඩ	23,256.00	20,475.00
විදුලිය සහ ගෑස්	483,321.00	576,972.00
ලොන්ඩ්‍රි	315.50	1,210.00
ගොඩනැගිලි නඩත්තු	27,207.00	78,928.00
කාර්යාලීය උපකරණ නඩත්තු	277,363.69	288,578.96
ප්‍රවාහන	-	2,955.00
ස්ථාවර වත්කම් රක්ෂණය	-	64,607.78
බැංකු ගාස්තු	-	750.00
හර බදු - බණ්ඩාරවෙල	2,248.86	5,665.79
කුලී වාහන	819,480.00	537,859.90
අමුද්‍රව්‍ය	971,289.30	901,623.65
බාහිර කථිකාචාර්ය ගාස්තු	1,298,760.00	1,184,686.64
බොජුන් පත් සහ මල්	-	1,050.00
කාර්ය මණ්ඩල පුහුණු	-	37,500.00
පොත් පත් සහ සඟරා	163,668.00	10,850.00
පැමිණීමේ දිරිදීමනා	79,880.00	193,610.50
දත්ත සැකසුම්	11,425.00	-
මුළු වියදම්	9,453,768.36	9,339,810.77

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය - කොළඹ
ආදායම් සහ වියදම්

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා — අගය රුපියල්

	2011	2010 නැවත සකසන ලද
පාසල් ගාස්තු	12,148,290.37	11,142,404.42
වෘත්තීය පරීක්ෂණ ආදායම් සහ වෙනත්	1,529,895.31	842,008.60
චාරිකා සහ සංචාරක	6,208,000.00	6,926,277.50
ගොඩනැගිලි බදු	800,000.00	1,084,621.00
වෙනත් ආදායම්	96,902.84	625,987.96
වෙන්දේසි	910.00	-
හෝටල් පාසල් අදායම	104,856.62	-
මුළු අදායම	20,888,855.14	20,621,299.48
අඩු කළා		
පරිපාලන සහ ආයතනික වියදම්	114,235,153ග48	97,104,007.89
ක්ෂයවීම්	29,417,803.29	28,986,862.04
ශුද්ධ මෙහෙයුම් වියදම්	(122,764,101.63)	(105,469,570.45)
පරිපාලන සහ ආයතනික වියදම්		
වේතන සහ වැටුප්	25,000,067.44	24,964,142.86
නිවාඩු දීමනා	156,643.90	138,940.65
අතිරේක පැය සඳහා ගෙවීම්	523,750.00	-
අතිකාල	1,083,068.32	810,302.76
සේවක අර්ථසාධක අරමුදල	2,488,000.04	2,609,685.53
සේවක භාරකාර අරමුදල	501,152.96	525,772.92
සේවක සුභසාධනය	4,012,221.25	5,537,903.02
සේවක ආහාර සැපයුම්	3,838,495.59	-
ගමන් වියදම් - දේශීය	154,959.68	83,002.00
ගමන් වියදම් - විදේශීය	773,753.59	2,114,632.06
සංග්‍රහ කටයුතු - දේශීය	268,771.13	6,718.00
කාර්ය මණ්ඩල නිල ඇඳුම්	426,190.77	247,825.50
පවිත්‍රතා සැපයුම්	349,081.35	319,598.00
විවිධ සැපයුම්	8,221,436.23	5,924,464.01
ලිපි ද්‍රව්‍ය	2,499,796.32	2,344,335.75
මුද්‍රණ සහ ප්‍රකාශන	1,742,586.23	1,404,674.65
දුරකථන සහ විද්‍යුත් තැපෑල	2,955,554.29	2,323,520.89
තැපැල්, මුද්දර සහ විදුලි පණිවුඩ	153,191.06	259,712.59
විදුලිය සහ ගෑස්	15,299,023.05	13,846,958.04
ගාස්තු සහ බලපත්‍ර	748,440.00	1,030,588.66
ආර්ථික සේවා ගාස්තු	29,312.48	93,341.75
ස්ථාවර වත්කම් රක්ෂණය	1,113,039.40	799,476.70
ලොන්ඩ්‍රි	593,148.16	409,512.59
ගොඩනැගිලි නඩත්තු	5,500,665.07	1,471,636.84
උපකරණ නඩත්තු	2,918,068.66	3,068,578.39
ප්‍රචාරණය සහ ප්‍රවර්ධනය	3,165,275.57	3,587,163.15
ප්‍රවාහන	4,000.00	21,410.00
බැංකු ගාස්තු	83,082.93	109,323.35

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය - කොළඹ
ආදායම් සහ වියදම්

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා — අගය රුපියල්

	2011	2010 නැවත සකසන ලද
පරිපාලන සහ ආයතනික වියදම්		
හර බදු	50,324.06	128,731.00
වාහන නඩත්තුව සහ අලුත්වැඩියාව	2,510,108.92	270,130.00
කුලී වාහන	3,354,638.96	3,062,391.94
අමුද්‍රව්‍ය	8,192,602.25	7,543,017.81
බාහිර කථිකාචාර්ය ගාස්තු	2,828,317.50	3,146,505.82
බොජුන් පත් සහ මල්	9,350.00	8,540.00
මාර්ගෝපදේශක වැඩසටහන	7,350,747.66	4,703,053.25
විනිමය වෙනස්කම්	1,238.08	-
මණ්ඩලීය සභික දීමනා	168,000.00	16,500.00
කාර්ය මණ්ඩල පුහුණු	495,678.11	1,163,403.16
පොත් පත් සහ සඟරා	1,230,100.02	302,246.06
පාඩු සහ ලියාහැරීම්	61,516.22	-
සේවක පාරිතෝෂික	1,353,002.60	-
පැමිණීමේ දිරිදීමනා	1,110,411.75	1,361,146.65
ජලය	880,031.88	1,012,821.54
දත්ත සැකසුම්	36,310.00	-
විශේෂ පැවරුම් වැඩසටහන්	-	222,300.00
විගණන ගාස්තු	-	110,000.00
මුළු වියදම්	114,235,153.48	97,104,007.89

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය - මහනුවර
ආදායම් සහ වියදම්

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | අගය රුපියල්

	2011	2010 නැවත සකසන ලද
පාසල් ගාස්තු	3,597,727.58	2,728,863.96
වෘත්තීය පරීක්ෂණ ආදායම් සහ වෙනත්	133,307.45	31,916.84
වෙනත් ආදායම්	49,980.97	27,792.80
හෝටල් පාසල් අදායම	10,455.00	18,950.75
මුළු ආදායම	3,791,471.00	2,807,524.35
අඩු කළා		
පරිපාලන සහ ආයතනික වියදම්	15,486,063.69	12,201,804.12
ක්ෂයවීම්	1,100,861.83	867,853.00
ශුද්ධ මෙහෙයුම් වියදම්	(12,795,454.52)	(10,262,132.77)
පරිපාලන සහ ආයතනික වියදම්		
වේතන සහ වැටුප්	5,613,991.81	5,116,404.69
නිවාඩු දීමනා	36,414.25	42,510.60
අතිරේක පැය සඳහා ගෙවීම්	209,187.50	-
අතිකාල	57,812.07	53,971.28
සේවක අර්ථසාධක අරමුදල	637,998.95	545,782.52
සේවක භාරකාර අරමුදල	127,599.78	109,156.50
සේවක සුභසාධනය	376,230.08	241,563.66
ගමන් වියදම් - දේශීය	199,587.50	109,036.00
සංග්‍රහ කටයුතු - දේශීය	59,104.50	6,227.00
සේවක නිල ඇඳුම්	2,250.00	8,546.00
පවිත්‍රතා සැපයුම්	-	56,930.00
විවිධ සැපයුම්	1,832,787.19	1,010,084.53
ලිපි ද්‍රව්‍ය	125,748.13	118,072.20
මුද්‍රණ සහ ප්‍රකාශන	-	73,918.00
දුරකථන සහ විද්‍යුත් තැපෑල	705,098.32	264,009.12
තැපැල්, මුද්දර සහ විදුලි පණිවුඩ	24,600.50	27,952.00
විදුලිය සහ ගෑස්	889,178.28	499,505.86
ගාස්තු සහ බලපත්‍ර	19,401.74	23,970.10
ලොන්ඩ්‍රි	14,516.00	13,608.00
ගොඩනැගිලි නඩත්තු	45,033.13	372,574.27
කාර්යාලීය උපකරණ නඩත්තු	146,614.31	86,801.98
ප්‍රවාහන	1,400.00	21,524.00
බැංකු ගාස්තු	250.00	12,840.00
හර බදු - අනුරාධපුර	1,626.48	-
කුලී වාහන	951,499.18	180,595.00
අමුද්‍රව්‍ය	1,644,234.36	1,600,091.71
බාහිර කථිකාචාර්ය ගාස්තු	953,520.00	584,480.00
බොජුන් පත් සහ මල්	5,850.00	1,975.00
කාර්ය මණ්ඩල පුහුණු	36,615.00	3,000.00
පොත් පත් සහ සඟරා	182,851.00	9,680.00
පැමිණීමේ දිරිදීමනා	257,757.00	238,572.67
ජලය	278,160.63	205,757.88
දත්ත සැකසුම්	32,500.00	2,400.00
මහින්ද චින්තන වැඩසටහන	16,646.00	560,263.55
මුළු වියදම්	15,486,063.69	12,201,804.12

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය - කොග්ගල
ආදායම් සහ වියදම්

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා — අගය රුපියල්

	2011	2010 නැවත සකසන ලද
පාසල් ගාස්තු	4,49,706.50	3,209,321.91
වෘත්තීය පරීක්ෂණ ආදායම් සහ වෙනත්	545,28.12	88,555.03
වෙනත් ආදායම්	782,818.70	108,360.00
චාරිකා සහ සංචාරක	581,127.45	-
හෝටල් පාසල් අදායම	1,400.00	-
මුළු ආදායම	6,402,340.77	3,406,236.94
අඩු කළා		
පරිපාලන සහ ආයතනික වියදම්	15,653,364.34	14,836,801.72
ක්ෂයවීම්	2,165,703.10	1,196,836.63
ශුද්ධ මෙහෙයුම් වියදම්	(11,416,726.67)	(12,627,401.41)
පරිපාලන සහ ආයතනික වියදම්		
වේතන සහ වැටුප්	2,413,165.42	4,646,729.35
නිවාඩු දීමනා	9,940.00	34,327.00
අතිරේක පැය සඳහා ගෙවීම්	75,641.30	-
අතිකාල	235,657.69	65,521.90
සේවක අර්ථසාධක අරමුදල	47,131.53	583,788.86
සේවක භාරකාර අරමුදල	117,804.00	116,757.78
සේවක සුභසාධනය	58,359.00	275,247.20
ගමන් වියදම් - දේශීය	4,465.22	39,784.00
සංග්‍රහ කටයුතු - දේශීය	3,029.00	10,862.50
කාර්ය මණ්ඩල නිල ඇදුම්	1,996,906.35	8,546.00
පවිත්‍රතා සැපයුම්	68,788.93	-
විවිධ සැපයුම්	3,029.82	1,923,795.04
ලිපි ද්‍රව්‍ය	261,635.75	276,571.90
මුද්‍රණ සහ ප්‍රකාශන	23,256.00	69,112.00
දුරකථන සහ විද්‍යුත් තැපෑල	483,321.00	495,194.59
තැපැල්ල මුද්දර සහ විදුලි පණිවුඩ	315.50	34,546.50
විදුලිය සහ ගෑස්	27,207.00	694,066.97
ගාස්තු සහ බලපත්‍ර	277,363.69	2,154.89
ලොන්ඩ්‍රි	-	157,060.00
ගොඩනැගිලි නඩත්තු	-	154,333.50
උපකරණ නඩත්තු	-	483,862.96
ප්‍රවාහන	2,248.86	66,126.00
බැංකු ගාස්තු	819,480.00	1,125.00
කුලී වාහන	971,289.30	915,160.00
අමුද්‍රව්‍ය	1,298,760.00	2,351,685.43
බාහිර කථිකාචාර්ය ගාස්තු	-	1,022,355.00
බොජුන් පත් සහ මල්	-	13,889.00
මාර්ගෝපදේශක වැඩසටහන	163,668.00	-
පොත් පත් සහ සඟරා	79,880.00	8,720.00
පැමිණීමේ දිරිදීමනා	11,425.00	248,323.13
ජලය	9,453,768.36	135,635.22
දත්ත සැකසුම්		1,520.00
මුළු වියදම්	15,653,364.34	14,836,801.72

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය - රත්නපුරය
ආදායම් සහ වියදම්

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා — අගය රුපියල්

	2011	2010 නැවත සකසන ලද
පාසල් ගාස්තු	4,028,431.34	352,334.25
වෘත්තීය පරීක්ෂණ ආදායම් සහ වෙනත්	31,429.91	-
හෝටල් පාසල් අදායම	8,550.00	71,039.50
මුළු ආදායම	4,068,411.25	423,373.75
අඩු කළා		
පරිපාලන සහ ආයතනික වියදම්	9,023,756.48	141,714.45
ක්ෂයවීම්	1,408,150.93	217,311.65
ශුද්ධ මෙහෙයුම් වියදම්	(6,363,496.16)	64,347.65
පරිපාලන සහ ආයතනික වියදම්		
වේතන සහ වැටුප්	2,158,177.32	2,850.00
නිවාඩු දීමනා	13,182.75	-
අතිරේක පැය සඳහා ගෙවීම්	324,750.00	-
අතිකාල	80,012.04	-
සේවක අර්ථසාධක අරමුදල	223,996.06	-
සේවක භාරකාර අරමුදල	44,799.21	-
සේවක සුභසාධනය	162,791.00	-
ගමන් වියදම් - දේශීය	26,086.00	-
සංග්‍රහ කටයුතු - දේශීය	15,576.50	-
සේවක නිල ඇඳුම්	75,260.71	-
පවිත්‍රතා සැපයුම්	4,853.00	-
විවිධ සැපයුම්	1,659,914.48	129,474.45
ලිපි ද්‍රව්‍ය	102,459.70	-
දුරකථන සහ විද්‍යුත් තැපැල	174,360.17	-
තැපැල්, මුද්දර සහ විදුලි පණිවුඩ	15,304.00	1,890.00
විදුලිය සහ ගෑස්	795,743.71	-
ලොන්ඩ්‍රි	15,535.00	-
ගොඩනැගිලි නඩත්තු	59,551.06	-
කාර්යාලීය උපකරණ නඩත්තු	86,448.59	-
හර බදු	1,301.58	-
බැංකු ගාස්තු	-	7,500.00
කුලී වාහන	252,245.00	-
අමුද්‍රව්‍ය	1,499,629.10	-
බාහිර කථිකාචාර්ය ගාස්තු	874,287.50	-
බොජුන් පත් සහ මල්	316.00	-
පොත් පත් සහ සඟරා	155,252.00	-
පැමිණීමේ දිරිදීමනා	148,440.00	-
ජලය	53,484.00	-
මුළු වියදම්	9,023,756.48	141,714.45

සටහන: රත්නපුර හෝටල් පාසල 2010 සැප්තැම්බර් 01 වන දින ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය - සමුද්‍රා හෝටලය
ආදායම් සහ වියදම්

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා — අගය රුපියල්

	2011	2010 නැවත සකසන ලද
විකුණුම් අවන්හල	10,284,847.46	10,643,596.53
විකුණුම් බීමහල	1,030,139.90	300,952.86
විකුණුම් කාමර	3,583,399.50	3,434,328.45
වෙනත් ආදායම්	2,239,709.77	2,820,065.69
මුළු ආදායම	17,138,096.63	17,198,943.53
අඩු කළා		
විකිණුම් පිරිවැය	5,296,505.11	4,043,722.99
දළ ලාභය	11,841,591.52	13,155,220.54

විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා විගණකාධිපති දෙපාර්තමේන්තුව

2011

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: ටීඑම්/එච්/එස්එල්අය / ටීඑච්ටීඑම්/එෆ්ඒ/2011

ඔබේ අංකය / உமது இல / Your No.:

දිනය / திகதி / Date: 2012 ඔක්තෝබර් 13 දින

සභාපති,
ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය.

ශ්‍රීලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

ශ්‍රීලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2012 අගෝස්තු 21 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රීලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රීලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.ගි.ප්‍ර.)

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

ශ්‍රී. ලං. ගි. ප්‍ර. යොමුව (අ) ශ්‍රී. ලං .ගි. ප්‍ර. 18	අනුකූල නොවීම දක්වා ඇති පරිදි ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම වෙනම ගිණුම්වල පෙන්නුම් කර නොතිබුණි.
(ආ) ශ්‍රී. ලං. ගි. ප්‍ර. 18	සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්, භාවිතයට නොගන්නා වත්කම් සහ භාවිතයෙන් ඉවත් කරන ලදවත්කම් වෙනම හදුනා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම ලෙස රු. 36,780,516 ක් හඳුනාගෙන තිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

එක් එක් හෝටල් පාසල් ශාඛා සඳහා වෙනම ම ආදායම් ප්‍රකාශන පිළියෙල කර තිබුණ ද ප්‍රධාන කාර්යාලයේ වියදම් පාසැල්වලට විභාජනය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. මෙයට අමතරව, සමුද්‍රා හෝටලයට සෘජු හා වක්‍ර පොදු කාර්ය වියදම් විභාජනය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ද මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) රු. 3,471,973 ක් වූ කාර්යාල උපකරණ සහ සවිකිරීම් විවිධ උපකරණ ලෙස ගිණුම්ගත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම මෙම වත්කම්වල මුළු පිරිවැයෙන් 2.5% ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) කෙරීගෙන යන වැඩ සඳහා වන වගකීම් හඳුනා ගැනීමකින් තොරව, රු. 3,927,524 ක් උපචිත

වියදම් ගිණුම මගින් කෙරීගෙන යන ගිණුමට බැර කර තිබුණි. මෙම වැරදි සහගත ගැළපීම හේතුවෙන් සමාන වටිනාකමකින් කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) රු.1,959,360 කට මිලදී ගත් පුස්තකාල පොත්, ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට අයභාර වියදමක් ලෙස ආදායම් ප්‍රකාශයට ලියාහැර තිබුණි.

2.2.4 නොසැසඳු ගිණුම්

අදාළ උපයෝගී වාර්තාවල සඳහන් ශේෂයන් සමඟ සැසඳීම් නොකිරීම නිසා ආයතනයේ මූල්‍ය ප්‍රකාශන හා අදාළ උපයෝගී වාර්තා අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

පාලන ගිණුම් විස්තරය	ගිණුම් අනුව ශේෂය (හර/බැර) රු.	උපයෝගී වාර්තාවල විස්තරය	උපයෝගී වාර්තා අනුව ශේෂය (හර/බැර) රු.	වෙනස (හර/බැර) රු.
(අ) ශ්‍රීලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු මුදල්	52,211,595 (හර)	ශ්‍රීලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ගිණුම්	6,476,785 (බැර)	45,734,810 (හර)
(ආ) - එම -	863,709 (හර)	- එම -	නැත	863,709 (හර)
(ඇ) ශ්‍රීලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු	3,934,242 (බැර)	- එම -	8,803,136 (බැර)	4,868,844 (හර)
(ඈ) ශ්‍රීලංකා සම්මේලන කාර්යාංශයෙන් ලැබිය යුතු	244,166 (හර)	ශ්‍රීලංකා සම්මේලන කාර්යාංශයේ ගිණුම්	98,469 (බැර)	145,697 (හර)
(ඉ) ශ්‍රීලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයෙන් ලැබිය යුතු	734,666 (හර)	ශ්‍රීලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ගිණුම්	54,179 (බැර)	680,487 (හර)
(ඊ) - එම -	3,128,263 (හර)	- එම -	නැත	3,128,263 (හර)
(උ) ශ්‍රීලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට ගෙවිය යුතු	නැත	- එම -	658,734 (හර)	658,734 (හර)

2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කළ කාල විශ්ලේෂණයට අනුව, වෙළඳ ණයගැතියන් අතුරින් රු. 3,927,892 ක් වර්ෂ 4 කට වැඩි කාලයක සිට හිඟව පැවතිණි. එසේම ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයෙන් ලැබිය යුතු පිළිවෙළින් රු. 6,939,510 ක් හා රු. 734,666 ක් වර්ෂ 4 කට වැඩි කාලයක සිට හිඟ පිට පැවතුණි.

(ආ) විගණනයට ලැබුණු තොරතුරුවලට අනුව, විවිධ ණය හිමියන් අතුරින් රු.3,934,242 ක් තථ්‍ය වගකීම් හඳුනා නොගැනීම හේතුවෙන් 2007 වර්ෂයේ සිට නොපියවා පැවතුණි. එසේ වුවත්, හඳුනා නොගත් බැර ශේෂයන් ගිණුම්වලින් ලියා හැරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) සංචාරක අමාත්‍යාංශයෙන් අය කරගත යුතු රු.1,232,233 ක මුදල් අදාළ මූලාශ්‍ර ලියවිලි අමාත්‍යාංශයේ හෝ ආයතනයේ නොවීම නිසා අය කරගැනීම අවිනිශ්චිතය.

(ඈ) කාර්ය මණ්ඩලයට ලබාදී තිබුණු රු. 811,030 ක් වූ අත්තිකාරම් වර්ෂ 4 කට වැඩි කාලයක සිට පියවා නොතිබුණි.

2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම්වල වු එකතුව රු.571,985,108 ක් වු විෂයයන් එකොළහකට අදාළ උපයෝගී ලියවිලි, ගණනය කිරීම් විස්තර, කොන්තාත් ගිවිසුම්, සත්‍යාපන වාර්තා, වත්කම් ලේඛණ, තොග ගැළපීම්වලට අදාළ විස්තර, ටෙන්ඩර් ලියවිලි යනාදිය නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2.2.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකුල නොවීම

පහත සඳහන් අනුකුල නොවු අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකුල නොවීම
(අ) 1971 අංක 38 දරන මුදල් පනත (i) 8(1) වගන්තිය	අයවැය ලේඛනයක් පිළියෙල කර තිබුණ ද, එය මුදල් වර්ෂය ආරම්භවීමට මාස තුනක කාලයකට පෙර පිළියෙල කර නොතිබුණි.
(ii) 10(5) වගන්තිය	2008 වර්ෂයේ සිට ආයතනයේ ශුද්ධ අතිරික්තය ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. පසුගිය වර්ෂ තුනක කාලය සඳහා ආයතනයේ ශුද්ධ අතිරික්තය රු. මිලියන 100 ක් පමණ විය.
(iii) 14(1) වගන්තිය	සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ කාර්ය සාධනය දක්වමින් කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.
(ආ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු (වැට්) පනතේ 58 වගන්තිය	බදු අය කළ හැකි කාල පරිච්ඡේදයේ අවසාන දින සිට මාස 2 ක් ඇතුළත වැට් බදු ප්‍රතිපූර්ණය කළ යුතු වේ. එසේ වුවත්, රු. 5,346,433 ක් වු බදු ආපසු ගැනීම් ප්‍රතිපූර්ණය කිරීමට පියවර නොගෙන 2007 වර්ෂයේ සිට ගිණුම්වල දක්වා තිබුණි.
(ඇ) 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී/12 දරන යහපාලනය සඳහා වු රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ චක්‍රලේඛය.	
(i) 4 පරිච්ඡේදයේ 4.2.2 වගන්තිය	මාසික කාර්ය සාධන වාර්තා, මෙහෙයුම් ප්‍රකාශන, ප්‍රසම්පාදනය කරන ලද ද්‍රව්‍යවල වටිනාකම, මානව සම්පත් වාර්තා, ණයගැති, ණය හිමි හා තොග කාල විශ්ලේෂණ සහ චලනය නොවන, සෙමින් චලනය වන සහ අභාවිත තොග පිළිබඳ වාර්තා පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට ජ්‍යෙෂ්ඨ කළමණාකරණය වගකිව යුතු වුවත්, එම තොරතුරු පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ii) 7 පරිච්ඡේදයේ 7.4.1 වගන්තිය	විගණන හා කළමනාකරණ කමිටුව අවම වශයෙන් මාස 3 කට වරක් හෝ ක්‍රමානුකුල පදනමක් මත රැස්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.

	(සසස) 9 පරිච්ඡේදයේ 9.12 වගන්තිය	ව්‍යාපාරයක් විසින් අනුගමනය කරන ඕනෑම සුභසාධන යෝජනා ක්‍රමයක් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතුය. එසේ වුවත් සේවකයන් සඳහා වූ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා එම අනුමැතිය ආයතනය විසින් ලබාගෙන නොතිබුණි.
	(සඩ) 9 පරිච්ඡේදයේ 9.14.1 වගන්තිය	මානව සම්පත් කළමනාකරණයට අදාළ රීති හා රෙගුලාසි පිළිබඳ සියලු කරුණු ඇතුළත් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පරිච්ඡේදයක් සහිත පරිපාටි සංග්‍රහය භාණ්ඩාගාර ලේකම්ගේ එකඟත්වය සහිතව පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතු වුවත් ආයතනය මෙම අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි.
(ඈ)	2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛයේ 4 පරිච්ඡේදයේ 4.2.1 (අ) සහ (ඇ) වගන්තිය	අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් ආවරණය වන පරිදි ඉදිරි වර්ෂය සඳහා විස්තරාත්මක සැලැස්මක් සමඟ ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, ආයතනය ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.
(ඉ)	2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑඅයි/2002 /2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	ආයතනය සතු පරිගණක, පරිගණක උපාංග සහ මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛණයක් චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි පවත්වා නොතිබුණි.
(ඊ)	ආයතන සංග්‍රහයේ ඍෂ පරිච්ඡේදයේ 10.2 වගන්තිය	මානව සම්පත් කළමනාකරණයට අදාළ ආයතනයේ බඳවාගැනීම්, උසස්කිරීම්, මාරුකිරීම්, වැටුප් වර්ධක ගෙවීම් ආදී ආයතනය විසින් නිකුත් කරන ලද ලිපි පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි.

2.2.8 අධිකාර බලය නොලත් ගනුදෙනු

රු. 7,253,641 ක් වූ ණයට විකුණුම් අධ්‍යක්ෂ ජනරාල් වරයාගෙන් අදාළ අනුමැතිය ලබාගැනීමකින් තොරව සිදු කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු. 55,649,410 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 41,659,120 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.13,990,290 ක වර්ධනයක් දැක්වුණි. රු. 48,930,565 කින් සංචාරක සංවර්ධන හා ආගමන බදු, හෝටල් පාසැල් ගාස්තු සහ වෙනත් ආදායම් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි වැඩි වීමට මූලික හේතුව වී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ ආයතනයේ ආදායම රු. මිලියන 265 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ වූ රු. මිලියන 217 සමඟ සැසඳීමේදී 22% ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. එසේම ඉකුත් වර්ෂයේ ඉගැන්වීම්, පුහුණු කිරීම් සහ සංවර්ධන කටයුතු වෙනුවෙන් වැය කර තිබුණු රු. මිලියන 175 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළදී ඒ සඳහා රු. මිලියන 209 ක් වැය කර තිබුණි. ඒ අනුව 19% ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ ආදායම් හා වියදම්වල වෙනස්වීම් පහත දැක්වේ.

	2011 රු. (මි)	2010 රු. (මි)	විචලනය රු. (මි)	%
ආගමන හා සංචාරක සංවර්ධන බදු	214	173	41	23
වෙනත් ආදායම්	51	44	7	16
පරිපාලන වියදම්	74	67	7	10
ඉගැන්වීම් ද්‍රව්‍ය හා භාවිතා කළ පරිභෝජ්‍ය ද්‍රව්‍ය	98	74	24	32
ක්ෂය හා වෙනත් වියදම්	37	34	3	08
ශුද්ධ අතිරික්තය	56	42	14	33

3.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ස්කන්ධ අනුපාත	සම්මත අනුපාතය	2011	2010	2009
ජංගම අනුපාතය	2.1	5.72	5.28	4 . 4 1
ක්ෂණික අනුපාතය	1.1	5.67	5.23	2.85

සම්මත අනුපාත සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ජංගම හා ක්ෂණික අනුපාතයන් සම්මත මට්ටම් මෙන් පස් ගුණයක් පමණ විය. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මුළු ජංගම වත්කම්වලින් පිළිවෙළින් 53% ක් සහ 62% ක් මුදල් හා මුදල් හා සමාන වත්කම් නියෝජනය විය. එසේ වුවත්, විධිමත් මූල්‍ය කළමනාකරණයක් නොවීම නිසා අතිරික්ත මුදල් දිගු කාලීන සහ මධ්‍ය කාලීන ආයෝජනවල යොදවා නොතිබුණි. සමාලෝචිත වර්ෂය මුළුල්ලේ රු. මිලියන 150 කට වැඩි අතිරික්ත මුදල් බැංකු ගිණුම්වල පැවතුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 හෝටල් පාසැල්වල කාර්ය සාධනය

4.1.1 ශිෂ්‍යයන් පුහුණු කිරීම (අභ්‍යන්තර)

පාඨමාලාවේ නම	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව
නිපුණතා මට්ටම	404	266
සහතික පත්‍රමට්ටම	1214	862
කළමනාකරණ මට්ටම	183	මෙම පාඨමාලාව 2012 වර්ෂයේ සම්පූර්ණ කිරීමට නියමිතය
අන්තර්වාර මට්ටම	30	28
උසස් මට්ටම	36	33
එකතුව	1867	1189

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරණ මට්ටමේ පාඨමාලා හැර, ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් පාඨමාලා සම්පූර්ණ කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව 1189 ක් හෙවත් 63% ක් විය. 2010 වර්ෂයේදී ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව සහ පාඨමාලා සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙළින් 1094 ක් හා 943 ක් විය.

(ආ) විගණනය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, හෝටල් පාසැල් ශාඛා හයක ඉගැන්වීම් කටයුතු වෙනුවෙන් දරා තිබුණු සෘජු පිරිවැය රු. මිලියන 209 ක් විය. එසේ වුවත් එක ශිෂ්‍ය පිරිවැයට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සංයුක්ත සැලැස්මට අනුව, වර්තමාන සංචාරකයන්ගේ පැමිණීම වන මිලියන 0.88 ක ප්‍රමාණය හා සැසඳීමේදී 2016 වන විට සංචාරකයන්ගේ පැමිණීමේ ප්‍රමාණය මිලියන 2.5 කින් වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. එසේ වුවත් ඉහත ඉලක්කයට සමගාමීව කර්මාන්තයේ සමස්ත අරමුණු ළඟා කරගැනීමට අවශ්‍ය මානව සම්පත් අවශ්‍යතාවය සම්පූර්ණ කරගැනීම පිණිස ආයතනය විසින් උපාය මාර්ග සැලසුම් කර නොතිබුණි.

4.1.2 පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ආයතනයේ බාහිර පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට අදාළ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය භාෂා 11 ක් පුහුණු කිරීම් වැඩසටහන් සඳහා සැලසුම් සකස් කර තිබුණද, ක්‍රියාත්මක කර තිබුණේ භාෂා 4 ක් පුහුණු කිරීමේ වැඩ සටහන් පමණි.

(ආ) ආයතනය විසින් සමාලෝචිත වර්ෂය තුළදී ඉලෙක්ටෝනික් මාධ්‍ය පදනම් කරගත් පුහුණු වැඩසටහන් ක්‍රිය ාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද, ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් නොවීම නිසා වැඩසටහන ක්‍රිය ාත්මක කර නොතිබුණි.

4.2 අරමුදල් උපයෝජනය

දුර්වල මූල්‍ය කළමනාකරණය හේතුවෙන් රු. මිලියන 96 සිට රු. මිලියන 99 අතර වූ බැංකු ශේෂයක් ආයතනයට කිසිදු ප්‍රතිලාභයක් නොමැතිව සමාලෝචිත වර්ෂය මුළුල්ලේම ජංගම ගිණුමේ නිෂ්කාර්යව තිබීමට ඉඩ හැර තිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

සංචාරක සම්පත් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2008 ජනවාරි මාසයේදී මිලගට ගත් වටිනාකම රු. 11,929,385 ක් වූ හෝටල් උපකරණ 2012 ජුලි 30 දින වන විට ද නිෂ්කාර්යව තිබුණි.

4.4 ආර්ථික නොවූ ගනුදෙනු

ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමෙන් හා පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමෙන් තොරව සහ ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව සමුද්‍ර හෝටලයේ කාමර නවීකරණය කර තිබුණි. ඉදිකිරීම් වැඩ පෞද්ගලික සමාගමකට රු. මිලියන 51 ක් වූ ඉදිරිපත් කළ මිල ගණන මත පවරා තිබුණි. නිම කරන ලද
කොන්තාත් වැඩවල දුර්වල තත්ත්වය හේතුවෙන් ඇස්තමේන්තුගත අලාභය මුළු පිරිවැයෙන් අර්ධයක් විය හැකිය.

4.5 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ගුණාත්මක භාවය සහ විශ්වාසවන්ත භාවය

සමාලෝචිත වර්ෂය තුළදී හා ඉකුත් වර්ෂ දෙක තුළදී පරිගණක හා පරිගණක මෘදුකාංග මිලට ගැනීම සඳහා රු. මිලියන 30 ක් වැය කර තිබුණ ද, ආයතනයේ කළමනාකරණ තොරතුරුවල අවශ්‍යතාවය හඳුනාගෙන විධිමත් තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක කර නොතිබුණි.

4.6 මානව සම්පත් කළමනාකරණය

විගණනයට ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, සමුද්‍ර හෝටලයේ කාර්ය මණ්ඩලය ද ඇතුළත්ව සමාලෝචිත වර්ෂයේ ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය 99 ක් විය. කථිකාචාර්යවරුන් 16 ක් ද ඇතුළත්ව පුරප්පාඩු සංඛ්‍යාව 36 ක් විය. සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂයේදී, ආයතනය විසින් වැටුප්, වේතන හා අනෙකුත් දීමනා සඳහා පිළිවෙළින් රු. මිලියන 74 ක් සහ රු. මිලියන 67 ක් වැය කර තිබුණි.

4.7 ප්‍රවාහන ඇණිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයේ වාහන ඉන්ධන, නඩත්තු අළුත්වැඩියා වියදම් සඳහා රු. 1,057,641 ක් වැය කර තිබුණි. එසේ වුවත් ධාවනය කළ දුර ප්‍රමාණයන්වල විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ කුලී පදනම මත වාහන 07 ක් ලබාගැනීම සඳහා රු. 3,355,862 ක මුදලක් වැය කර තිබුණි. එසේ වුවත්, කුලියටලත් වාහන ධාවනය කළ දුර පිළිබඳ අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2010 සිට 2016 වර්ෂය දක්වා ආයතනය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණි. එසේ වුවත් සමාලෝචිත වර්ෂය හා සම්බන්ධිත උපාය මාර්ගයන් තුනට අදාළ ඇතැම් ප්‍රධාන කාර්යයන් එනම්, මිනිස් බලය සංවර්ධනය කිරීමේ උපාය මාර්ගයන්, නිෂ්පාදන සංවර්ධන උපාය මාර්ගයන් සහ අලෙවිකරණ උපාය මාර්ගයන් වාර්ෂික වැඩසටහන්වලට අනුකූලව ක්‍රියාත්මක කර නොතිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර තිබුණි. පහත දක්වා ඇති පරිදි ඇතැම් ඉලක්කයන් සමාලෝචිත වර්ෂය තුළදී ළඟාකරගෙන නොතිබුණි.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී අභ්‍යන්තර පාඨමාලා පැවැත්වීම තුළින් ශිෂ්‍යයන් 2,500 ක් පුහුණු කිරීමට සැලසුම් කර තිබුණ ද, ශිෂ්‍යයන් 1,189 ක් පමණක් පුහුණු කර තිබුණි.

(ආ) තරුණයන් බලගැන්වීමේ වැඩ සටහන යටතේ ශිෂ්‍යයන් 1,000 ක් පුහුණු කිරීමට සැලසුම් කර තිබුණි. එසේ වුවත්, ශිෂ්‍යයන් 400 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළදී පුහුණු කර තිබුණි.

(ඇ) පෞද්ගලික අංශයේ හෝටල් පාසැල්වල සහභාගීත්වයෙන් ශිෂ්‍යයන් 1750 ක් වරලත් වැඩසටහන යටතේ පුහුණු කිරීම සහ සංචාරක කර්මාන්තයේ යෙදී සිටින කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා අවශ්‍ය කුසලතා ලබාදීම සඳහා යෝජනාව සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි.

5.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත හා තථ්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. අයවැයගත වියදම හා සැසඳීමේදී ඇතැම් වියදම් විෂයන්වල තථ්‍ය වියදම 12% සිට 427% දක්වා ඉක්මවා තිබුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව දක්නට ලැබුණි.

5.4 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා 2007 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන අංශයක් ආයතනයේ පිහිටුවා නොතිබුණි.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

(ආ) අයවැය

(ඇ) මානව සම්පත් කළමනාකරණය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) ප්‍රසම්පාදනය

(ඊ) අත්තිකාරම් ගෙවීම්

(උ) ගිණුම්කරණය හා පොත් තැබීම

(ඌ) අභ්‍යන්තර විගණනය

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති